# දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

## 2021 වාර්ෂික වාර්තාව හා ගිණුම්

**දැක්ම**

රටේ සෞඛ්‍ය අවශ්‍යතාවන් සපුරාලීම සහ ප්‍රතිචාරාත්මක ආකාරයකින් කලාපීය සහ ගෝලීය සෞඛ්‍ය වෙනුවෙන් කැපවීම පිණිස ඉහළ වෘත්තීමය ප්‍රමිතීන් අත්කර ගත් ආයුර්වේදය, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක සෞඛ්‍ය විශේෂඥයන් බිහි කරන විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ, කලාපයේ සහ ලෝකයේ ජනතා වෙනුවෙන් ප්‍රශස්ත මානුෂීය සෞඛ්‍ය රැකවරණයක් ලබාදීම පිණිස විශිෂ්ට සායනික සහ පර්යේෂණ නිපුණතාවලින් සවිබල, ආයුර්වේදය, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක වෛද්‍ය ක්‍රම පිළිබඳ දැනුම සහ කුසලතා ඇති විශේෂඥයන් බිහි කිරීම

## පටුන

**අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය**


**1. ආයතනය .......... 1**

1.1 කෙටි හැඳින්වීම .......... 1

1.2 ආයතනයේ අධ්‍යක්ෂවරයා.......... 2

1.3 කළමනාකරණ මණ්ඩලය .......... 2

1.4 මූල්‍ය කමිටුව .......... 3

1.5 අධ්‍යයන මණ්ඩල .......... 4

1.6 පුස්තකාල කමිටුව .......... 6

1.7 තොරතුරු තාක්ෂණ කමිටුව .......... 7

1.8 විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව .......... 7

1.9 අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව .......... 8

**2. 2021 වර්ෂය තුළ අධ්‍යයන කටයුතු .......... 9**

2.1 වෛද්‍ය විශාරද ආයුර්වේද සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන්. .......... 9

2.2 වෛද්‍ය විශාරද සිද්ධ සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන. .......... 14

**2.3 වෛද්‍ය විශාරද යුනානි සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන්. .......... 14**

**3. පරිපාලන අංශ .......... 15**

3.1 පරිපාලන අංශය.......... 15

3.2 මූල්‍ය අංශය.......... 15

3.3 පුස්තකාලය .......... 15

**4. මානව සම්පත් දත්ත .......... 17**

4.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය.......... 17

**5. 2021 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය .......... 19**

**6. විගණකාධිපති වාර්තාව .......... 45**

**7. විගණකාධිපති වාර්තාවට පිළිතුරු.......... 51**

**8. තිරසර සංවර්ධනය සඳහා යෝජනාව .......... 55**

**අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය**



2021 වර්ෂය සඳහා වූ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම මාගේ මහත් ප්‍රීතියට කරුණකි. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේදය, යුනානි සහ සිද්ධ අධ්‍යාපනය සඳහා විශේෂඥයින් සැපයීමේ පූර්ණ වගකීම ඇති ආයතනය වේ.

අපගේ අධ්‍යයන මණ්ඩල තුන සහ විශේෂඥ මණ්ඩල හත අධ්‍යයන මණ්ඩල සහතිකය සහිත විශේෂඥ ආයුර්වේද වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් පහක් පවත්වනු ලබයි. නව විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් හයක් සඳහා වූ ප්‍රවිවරණයන් (prospectuses) සෙනෙට් සභාව මගින් අනුමත කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා එහි තත්ත්ව සහතික කවුන්සිලයට යොමු කර ඇත. සිසුන් බඳවා ගැනීම සඳහා පළමු වැනි තෝරා ගැනීමේ පරීක්ෂණය 2021 වර්ෂයේ දී පවත්වන ලදී.


තව ද, ආයතනයට 2021-2025 වර්ෂ සඳහා වූ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සංයුක්ත සැලැස්ම සකස් කිරීමට හැකි විය. යෝජිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය පිහිටුවීම සඳහා මූලික පියවර ගැනීම, විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව, අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව, පුස්තකාල කමිටුව සහ තොරතුරු තාක්ෂණ කමිටුව වැනි කළමනාකරණ මණ්ඩලයේ ස්ථාවර කමිටු කිහිපයක් ස්ථාපිත කිරීම සිදු කරන ලදී. මෙම පුස්තකාලය සඳහා අවශ්‍ය කරන ග්‍රන්ථ සහ කාර්යාලීය උපකරණ මිල දී ගැනීමේ ක්‍රියාවලිය ද සිදු කරමින් ඇත. අනෙක් අතට, මානව සම්පත ශක්තිමත් කිරීම පිණිස ආයතනය මගින් සහකාර පුස්තකාලයාධිපතිවරයෙක් සහ අනෙකුත් කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කරන ලදී.

එබැවින් මා, මෙම වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙනුවෙන් සිය දායකත්වය කැප කළ කළමනාකරණ මණ්ඩලයේ, අධ්‍යයන මණ්ඩල, විශේෂඥ මණ්ඩල සාමාජිකයන්, පුහුණුකරුවන් සහ පරීක්ෂකවරුන් හට මාගේ කෘතඥතාව පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම 2021 වර්ෂය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා ඉතා ඵලදායී වර්ෂයක් බවට පත් කිරීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී, සහකාර පුස්තකාලයාධිපති සහ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනෙකුත් කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තූතිය පළ කරන්නෙමි.

***මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන***

***අධ්‍යක්ෂ***

# ආයතනික ව්‍යුහය


කළමණාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂක
පරිපාලන අංශය
මූල්‍ය අංශය
පුස්තකාලය
අධ්‍යයන මණ්ඩලය
මූල්‍ය කමිටුව
විගණන කමිටුව
පුස්තකාල කමිටුව
තොරතුරු තාක්ෂණ කමිටුව
වි.සං.ඇ.ක
ජා.ස.ස.ක.
ජ්‍යේ.ස.ලේ.
ජ්‍යේ.ස.මූ.
සහකාර පුස්තකාලාධිපති
විශේෂඥ මණ්ඩලය
ශාස්ත්‍රීය සහ විභාග
පාලන සහ ආයතන
ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි
ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි
ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි
ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි
ජ්‍යේ.ස.ලේ. - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකඛාධිකාරි
ජ්‍යේ.ස.මූ. - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි
ජා.ස.ස.ක.- ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ කමිටුව
වි.සං.ඇ.ක. - විෂයමාලා සංවර්ධන ඇගයීම් කමිටුව

# 1. ආයතනය

## 1.1 *කෙටි හැඳින්වීම*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2017 දෙසැම්බර් 08 වැනි දිනැති, අංක 2048/46 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ආයතනයක් ලෙස පිහිටුවා ඇති අධ්‍යාපන ආයතනයකි. ඒ අනුව ආයතනය සෞඛ්‍ය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා මානව සම්පත් අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේදය, යුනානි සහ සිද්ධ අධ්‍යාපනය සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දිවයිනට අවශ්‍ය කරන ශ්‍රම බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන අධ්‍යයන පාඨමාලා ආරම්භ කිරීමට යෝග්‍ය පියවර ගෙන ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙයුම් කටයුතු 2019 පෙබරවාරි මස 25 වැනි දින කළමනාකරණ මණ්ඩලයේ පළමු වැනි රැස්වීම පැවැත්වීමෙන් පසුව 2019 මාර්තු මාසයේ දී ආරම්භ කරන ලදී. ආයතනය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දෙන තෙක් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් බොරැල්ලේ පිහිටි ආයුර්වේද ශික්ෂණ රෝහල තුළ තාවකාලික ගොඩනැගිල්ලක ස්ථාපනය කර ඇත.

ආයුර්වේද, සිද්ධ සහ යුනානි විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් ආරම්භ කිරීම සඳහා අධ්‍යයන මණ්ඩලවල, කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට 2020 වර්ෂය තුළ දී පියවර ගෙන ඇති අතර දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අධ්‍යයන වැඩසටහන් 06ක් සඳහා 2020 සහ 2021 වර්ෂවල දී අනුමැතිය ලබා ගැනීමට හැකි විය. තව ද, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට 2021 වර්ෂය තුළ දී තවත් උපාධි වැඩසටහන් 6ක් සඳහා අනුමැතීන් ලබා ගැනීමට පියවර ගෙන ඇත. විශේෂඥ මණ්ඩල, අධ්‍යයන මණ්ඩල, කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතීන් සමඟ අදාළ අයදුම්පත්‍ර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කර ඇත.

ඒ හා සමගාමීව, ගොඩනැගිලි නවීකරණය සහ යන්ත්‍රසූත්‍ර ප්‍රසම්පාදන වැනි දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පියවර ගෙන ඇත. ඒ අනුව, පුස්තකාලය ඇති කිරීම පිණිස සුදුසු ඉඩකඩක් වෙන් කර ගැනීමට පියවර ගෙන ඇත. ආයුර්වේද

විෂය පිළිබඳ පුස්තකාල පොත් මිල දී ගනු ලැබූ අතර ආයුර්වේදය, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රම පිළිබඳ තවත් පුස්තකාල පොත් මිල දී ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ.

ආයතනයේ මානව සම්පත් ශක්තිමත් කිරීම පිණිස 2021 වර්ෂයේ දී අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම් කරන ලද අතර (දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පළමු ස්ථිර අධ්‍යක්ෂවරයා) සහකාර පුස්තකාලයාධිපතිවරයෙක්, කළමනාකරණ සහකාර නිලධාරීන් හතර දෙනෙක් සහ එක් කාර්මික නිලධාරියෙක් සමාලෝචිත වර්ෂය තුළ දී බඳවා ගන්නා ලදී.

### 1.2 ආයතනයේ අධ්‍යක්ෂවරයා

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ආයතනයේ අධ්‍යක්ෂවරයා වේ.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා 2021 පෙබරවාරි මස 11 වැනි දින දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පළමු වැනි ස්ථිර අධ්‍යක්ෂවරයා ලෙස රාජකාරී භාර ගන්නා ලදී.

එමෙන්ම මහාචාර්ය වසන්ත ගුණතුංග මහතා 2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 පෙබරවාරි මස 10 වැනි දින තෙක් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරන ලදී.

### 1.3 කළමනාකරණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක සහ අධ්‍යයන මණ්ඩලය වන අතර සෑම මාසයක දීම එහි රැස්වීම් පවත්වනු ලැබේ. 2020 වර්ෂය තුළ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ (සාමාන්‍ය සහ විශේෂ) රැස්වීම් 10ක් පවත්වන ලදී.

රැස්වීම් අංක,රැස්වීම් දින සහ සහභාගීවීම් පිළිබඳ වාර්තා පහත දක්වා ඇත.

| රැස්වීම් අංකය | රැස්වීම් දිනය | සහභාගී වූ සාමාජිකයන් සංඛ්‍යාව | සහභාගී නොවීමට හේතු ඉදිරිපත් කළ | සහභාගී නොවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 15 වැනි රැස්වීම | 2021.02.23 | 14 | 01 | 04 |
| 16වැනි රැස්වීම | 2021.03.19 | 12 | 01 | 05 |
| 17වැනි රැස්වීම | 2021.04.23 | 15 | 02 | 02 |
| 18වැනි රැස්වීම | 2021.05.21 | 11 | 01 | 06 |
| 19වැනි රැස්වීම | 2021.06.18 | 13 | 01 | 04 |
| 20වැනි රැස්වීම | 2021.07.22 | 15 | 02 | 01 |
| 21වැනි රැස්වීම | 2021.08.20 | 15 | 0 | 03 |

| | | | | |
|---|---|---|---|---|
| 22වැනි රැස්වීම | 2021.10.15 | 15 | 01 | 01 |
| 23වැනි රැස්වීම | 2021.11.19 | 15 | 0 | 03 |
| 24වැනි රැස්වීම | 2021.12.17 | 13 | 0 | 04 |

***1 වැනි වගුව***

සමාලෝචිත වර්ෂය තුළ දී පහත දැක්වෙන සාමාජිකයින් කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් විය.

| | |
|---|---|
| මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා | අධ්‍යක්ෂ (2021.02.11 සිට) |
| මහාචාර්ය වසන්ත ගුණතුංග මහතා | වැඩබලන අධ්‍යක්ෂ (2021.01.01 සිට 2021.02.10 දක්වා) |
| එම්. එම්. ක්‍රිෂාන්ති මිය | උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්/ නම් කළ නිලධාරී |
| කුමාරි වීරසේකර මිය | ලේකම්/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය (2021.01.01 සිට 2021.06.18 දක්වා) |
| ගීතාමණී කරුණාරත්න මෙය | දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්/ නම් කළ නිලධාරී (2021.06.17 සිට 2021.12.31 දක්වා) |
| හර්ෂනී ප්‍රනාන්දු මෙය | මුදල් අමාත්‍යාංශ ලේකම්/ නම් කළ නිලධාරී (2021.05.22 සිට 2021.12.31 දක්වා) |
| ටී. ඔසන් මහතා | (2021.01.01 සිට 2021.05.21 දක්වා) |
| වෛද්‍ය ධම්මික අබේගුණවර්ධන මහතා | ආයුර්වේද කොමසාරිස් |
| මහාචාර්ය පී. ඒ. පරණගම මිය | අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය |
| වෛද්‍ය තයාලින් තිලීපන් මිය | ප්‍රධානී, සිද්ධ වෛද්‍ය අංශය, යාපනය විශ්වවිද්‍යාලය |
| වෛද්‍ය එන්. වර්නකුලේන්ද්‍රන් මහතා | ප්‍රධානී, සිද්ධ වෛද්‍ය අංශය, ත්‍රිකුණාමලය මණ්ඩපය |
| වෛද්‍ය ස්වර්ණා කලුතොටගේ මිය | වැඩබලන අධ්‍යක්ෂ/BMARI |
| වෛද්‍ය ටී. වීරරත්න මහතා | විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (ආයුර්වේද) |
| වෛද්‍ය වී. සෙල්වනාදන් මිය | විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (සිද්ධ) |
| වෛද්‍ය තුසිතා සෙල්වවෙල්වම් මිය | විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (සිද්ධ) |
| වෛද්‍ය ඒ.ජී.එෆ්. නජීයා මිය | විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (යුනානි) |
| මහින්ද මඩිහහේවා මහතා | පාලක සභාව නම් කළ නිලධාරී |
| මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා | පාලක සභාව නම් කළ නිලධාරී |
| ටී. ධර්මරාජා මහතා | වි.ප්‍ර.කො.ස. පත් කළ සාමාජික |
| එස්.ඩී.ඩබ්ලිව්. සමන් දියගහ වඩුගේ මහතා | වි.ප්‍ර.කො.ස. පත් කළ සාමාජික |
| කේ.කේ. සමින්ද ප්‍රියංග කෝණාර මහතා | වි.ප්‍ර.කො.ස. පත් කළ සාමාජික |
| වෛද්‍ය ඩබ්ලිව්.ඒ.එල්. චන්ද්‍රසිරි වැලිවිට මහතා | වි.ප්‍ර.කො.ස. පත් කළ සාමාජික |

## 1.4 මූල්‍ය කමිටුව

සමලෝචිත වර්ෂය තුළ දී මූල්‍ය කමිටුවට පහත දැක්වෙන සාමාජිකයන් ඇතුළත් විය.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා - අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (2021 පෙබරවාරි මස 01වැනි දින සිට)

මහාචාර්ය පී. ඒ. පරණගම මත්මිය - අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

ටී. ධර්මරාජා මහතා - වි.ප්‍ර.කො.ස. පත් කළ කළමනාකරණ මණ්ඩල සාමාජික

ටී. ඔසන් මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, \රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

රැස්වීම් සංඛ්‍යාව, රැස්වීම් දින සහ සහභාගීවූවන්ගේ වාර්තා පහත දක්වා ඇත.
***1 වැනි වගුව***

| **රැස්වීම් අංකය** | **රැස්වීම් දිනය** | **සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව** | **නොපැමිණීමට කරුණු ඉදිරිපත් කළ** | **නොපැමිණි** |
|---|---|---|---|---|
| 4 වැනි රැස්වීම | 18/02/2021 | 4 | 0 | 0 |
| 5වැනි රැස්වීම | 07/04/2021 | 4 | 0 | 0 |
| 6වැනි රැස්වීම | 20/07/2021 | 4 | 0 | 0 |
| 7වැනි රැස්වීම | 06/10/2021 | 4 | 0 | 0 |
| 8වැනි රැස්වීම | 03/12/2021 | 4 | 0 | 0 |

## 1.5 අධ්‍යයන මණ්ඩල

අධ්‍යයන කටයුතු, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ තීරණ කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතියට යටත්ව, අධ්‍යයන මණ්ඩල (BOS) සහ විශේෂඥ මණ්ඩල (SpB) මඟින් ගනු ලැබේ. අධ්‍යයන මණ්ඩල (BOS) සහ විශේෂඥ මණ්ඩලවල රැස්වීම් මාසයකට වරක් පවත්වනු ලැබේ.

### 1.5.1 **අධ්‍යයන මණ්ඩල**

#### ***1.5.1.1 අධ්‍යයන මණ්ඩල ලැයිස්තුව***

ආයුර්වේද අධ්‍යයන මණ්ඩලය
සිද්ධ අධ්‍යයන මණ්ඩලය
යුනානි අධ්‍යයන මණ්ඩලය

#### ***1.5.1.2 2021 දී පවත්වන ලද අධ්‍යයන මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව***

| **මණ්ඩලයේ නම** | **පැවැත් වූ රැස්වීම් සංඛ්‍යාව** |
|---|---|
| ආයුර්වේද | 6 |
| සිද්ධ | 3 |
| යුනානි | 6 |

***2 වැනි වගුව***

#### ***1.5.1.3 අධ්‍යයන මණ්ඩලවල සභාපති සහ ලේකම් ධූරයන් – 2021***

| **අධ්‍යයන මණ්ඩලය** | **සභාපති** | **ලේකම්** |
|---|---|---|
| ආයුර්වේද | මහාචාර්ය එස්.එම්.එස්. සමරකෝන් මහතා | වෛද්‍ය ඩබ්ලිව්.ජේ. වික්‍රමාරච්චි මිය |
| සිද්ධ | වෛද්‍ය ඒ. ශ්‍රීධරන් මහතා | වෛද්‍ය එස්. ඌෂකාන්තන් මහතා |
| යුනානි | මහාචාර්ය එම්.එස්.එම්. ෂිෆා මහතා | වෛද්‍ය ඒ.එච්.ඒ. ෆසීනා මිය |

### 1.5.2 *විශේෂඥ මණ්ඩල*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තුළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන විෂයන් සඳහා විශේෂඥ මණ්ඩල 12ක් ඇත. 2020 වර්ෂයේ ස්ථාපිත කරන ලද යුනානි පිළිබඳ විශේෂඥ මණ්ඩල දෙකද මීට ඇතුලත්ය.

### *1.5.2.1 විශේෂඥ මණ්ඩල ලැයිස්තුව*

**ආයුර්වේද**
කෞමාරභෘතය පිළිබඳ විශේෂඥ මණ්ඩලය
කායචිකිත්සා පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ප්‍රසූතිතන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශල්‍යතන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ස්වස්තවෘත පිළිබඳ විශේෂඥ මණ්ඩලය
භයිසජ්‍ය කල්පන සහ රාසශස්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශාලක්‍ය තන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය

**සිද්ධ**
ගුණපාදම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය
මරුතුවම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

**යුනානි**
මෞලිජාත් පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ඉල්මුල් අද්විියා පිළිබඳ විශේෂඥ මණ්ඩලය
අම්රාස් ඊ නිස්වාන් වා කුවාබලාත් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

### *1.5.2.2 2021 වර්ෂයේ දී පවත්වන ලද විශේෂඥ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව*

| **මණ්ඩලයේ නම** | **පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව** |
|---|---|
| **ආයුර්වේද** | |
| භයිසජ්‍ය කල්පන සහ රසශාස්ත්‍ර | 3 |
| කෞමාරභෘතය | 8 |
| කායචිකිත්සා | 7 |
| ප්‍රසූතිතන්ත්‍ර | 7 |
| ශල්‍යතන්ත්‍ර | 9 |
| ස්වස්තවෘත | 7 |
| ශාලක්‍යතන්ත්‍ර | 2 |
| **සිද්ධ** | |
| ගුණපාදම් | 3 |
| මරුතුවම් | 3 |
| **යුනානි** | |
| මෞලිජිත් | 6 |
| ඉල්මුල් අද්වියා | 1 |
| අම්රාස් ඊ නිස්වාන් | 1 |

***4වැනි වගුව***

### *1.5.2.3 විශේෂඥ මණ්ඩලවල සභාපති සහ ලේකම් ධූරයන් – 2021*

| විශේෂඥ මණ්ඩලය | සභාපති | ලේකම් |
|---|---|---|
| **ආයුර්වේද** | | |
| කෞමාරභෘතය | වෛද්‍ය අයි.ඒ.එම්. ලීනා මිය | වෛද්‍ය ඕ.ටී.එම්.ආර්.කේ.එස්. කලවාන මිය |
| කායචිකිත්සා | මහාචාර්ය එස්.එම්.එස්. සමරකෝන් මහතා | වෛද්‍ය කේ.ජී.සී. දිසානායක මිය |
| ප්‍රසූතිතන්ත්‍ර | වෛද්‍ය කේ.පී.කේ.ආර්. කරුනාගොඩ මිය | වෛද්‍ය වයි.ඒ.යූ.ඩී. කරුණාරත්න මිය |
| ශල්‍යතන්ත්‍ර | වෛද්‍ය බී.එම්.එස්. අමරජීව මිය | වෛද්‍ය කේ.කේ.වී.එස්. පේෂල මිය |
| ස්වස්තවෘත | වෛද්‍ය ඩබ්ලිව්.එම්.එස්.එස්.කේ. කුලතුංග මිය | වෛද්‍ය කේ.එච්.ඒ.එස්. ජයසිංහ මිය |
| භයිසජ්‍ය කල්පන | වෛද්‍ය එස්.කේ.එම්.කේ. හැරපත්දෙනිය මිය | වෛද්‍ය එම්. වී. ආර්. විජයන්තිමාලා මිය |
| ශාලක්‍යතන්ත්‍ර | මහාචාර්ය කේ. පී. පී. පීරිස් මිය | වෛද්‍ය කේ.ජීත සුරංගි මිය |
| **සිද්ධ** | | |
| ගුණපාදම් | වෛද්‍ය එන්. වර්ණකුලේන්ද්‍රන් මහතා | වෛද්‍ය එන්. නිතියකුමාර් මිය |
| මරුතුවම් | වෛද්‍ය ටී. කුමුත්රන්ජන් මිය | වෛද්‍ය බී. උදයනන් මිය |
| **යුනානි** | | |
| මෞලිජිත් | වෛද්‍ය එම්.සී.එම්. මහීස් මහතා | වෛද්‍ය එම්.එච්.එම්. හෆීල් මයා |
| ඉල්මුල් අද්වියා | මහාචාර්ය එන්. ෆහාමියා මිය | වෛද්‍ය බී.අයි. නිහාර |
| අම්රාස් ඊ නිස්වාන් | මහාචාර්ය එම්.යූ.ඉසෙඩ්.එන්. ෆර්සානා මිය | වෛද්‍ය ජේ. රුම්සියා මිය |

*5 වැනි වගුව*

## 1.6 *පුස්තකාල කමිටුව*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා පුස්තකාලයක් ස්ථාපිත කිරීම සහ පුස්තකාල කටයුතු සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම පිණිස 2021 වර්ෂයේ දී පුස්තකාල කමිටුවක් පිහිටුවන ලදී. 2021.12.31 වැනි දින විට පහත දැක්වෙන සාමාජිකයින් පුස්තකාල කමිටුවේ සේවය කරන ලදී.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා - අධ්‍යක්ෂ/ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - සභාපති
මහාචාර්ය ආර්. එස්. ජයවර්ධන මහතා - ආයුර්වේද අධ්‍යයන මණ්ඩලයේ නියෝජිතයන්
වෛද්‍ය එම්. එස්. එස්. ෆවුමිනා මිය - යුනානි/ අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත
ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
ආචාර්ය සී. ආර්. ගමගේ මිය– ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
දිල්හානි මුණසිංහ මිය- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති - දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
ලක්මිණී මාරසිංහ - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති – වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය

රැස්වීම් සංඛ්‍යාව, රැස්වීම් දින සහ සහභාගීවීම් වාර්තා පහත දක්වා ඇත.

| රැස්වීම් සංඛ්‍යාව | රැස්වීම් දිනය | සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව | නොපැමිණීමට කරුණු ඉදිරිපත් කළ | නොපැමිණි |
|---|---|---|---|---|
| 01 වැනි රැස්වීම | 2021.03.31 | 09 | 00 | 00 |
| 02 වැනි රැස්වීම | 2021.07.08 | 08 | 00 | 01 |
| 03වැනි රැස්වීම | 2021.09.28 | 10 | 01 | 00 |
| 04වැනි රැස්වීම | 2021.12.09 | 10 | 00 | 02 |

## *1.7 තොරතුරු තාක්ෂණ කමිටුව*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තොරතුරු තාක්ෂණය සහ ඒ ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් මාර්ගෝපදේශය සැපයීම පිණිස කළමනාකරණ මණ්ඩලය මගින් තොරතුරු තාක්ෂණ කමිටුවක් සකස් කරන ලදී. මෙම තොරතුරු තාක්ෂණ කමිටුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවිය නිර්මාණය කිරීම සහ එම ආයතනයේ ජාල කටයුතු සම්බන්ධ වෙනත් ගැටළු සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙයි.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තොරතුරු තාක්ෂණ කමිටුව පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා - අධ්‍යක්ෂ/ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - සභාපති
මහාචාර්ය එස්. එම්. එස්. සමරකෝන් මහතා - දේශීය වෛද්‍ය ආයතනයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ නියෝජිත
මහාචාර්ය කුමාර මෙන්ඩිස් මහතා – වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය
වෛද්‍ය පණ්ඩුල සිරිබද්දන මහතා – වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
රුවන් කොහොඹකන්ද මහතා – තොරතුරු තාක්ෂණය පිළිබඳ උපදේශක/ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
ලහිරු චාමර මහතා – සහකාර ජාලකරණ කළමනාකරු/ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
තාක්ෂණික නිලධාරී – දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය – කමිටු ලේකම්

## **1.8** *විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව*

විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව පහත දැක්වෙන කාර්යයන් ඉටුකරවා ගැනීම පිණිස 2020 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

- විෂයමාලා සංවර්ධනය ආරම්භ කිරීම, විෂයමාලා ඇගයීම, සහ කළමනාකරණ මණ්ඩලයට විෂයමාලා නිර්දේශ කිරීම
- අධ්‍යයන කරුණු සහ පරීක්ෂණ සම්බන්ධ මාර්ගෝපදේශ සහ ලේඛන ඇගයීම සහ එම ලේඛන කළමනාකරණ මණ්ඩලයට නිර්දේශ කිරීම

**කමිටුවේ සංයුතිය:**

1. මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා - අධ්‍යක්ෂ/ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2. මහාචාර්ය ප්‍රියානි පීරිස් මිය– මහාචාර්ය - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය (සභාපති)
3. මහාචාර්ය ආර්. ඩී. එච්. කුලතුංග මිය – මහාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
4. වෛද්‍ය එස්. පී. මොල්ලිගොඩ මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
5. වෛද්‍ය ඕ. ටී. එම්. ආර්. කේ. එස්. බී. කලවාන මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
6. වෛද්‍ය කේ. කේ. වී. එස්. පේෂලා මිය- කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
7. වෛද්‍ය පුෂ්පා ජයකොඩි මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
8. වෛද්‍ය ඒ. එච්. ඒ. ෆසීනා මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
9. වෛද්‍ය එන්. වර්නකුලේන්ද්‍රන් මහතා- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - සිද්ධ වෛද්‍ය විද්‍යා අංශය ත්‍රිකුණාමලය මණ්ඩපය
10. වෛද්‍ය අසේල ඔලුපැලියාව මහතා – ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - වෛද්‍ය විද්‍යා පීඨය – කොළඹ විශ්වවිද්‍යාලය

## 1.9 *අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව*

අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා අනෙකුත් රටවල් සමඟ සහයෝගීතාවන් ඇති කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කරවීමේ පරමාර්ථය ඇතිව 2021 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. වර්තමානයේ සිටින විශේෂඥ වෛද්‍ය උපාධි හදාරන පුහුණුවන්නන්ගේ පශ්චාත් විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණුවීම් සඳහා ඉඩප්‍රස්ථා නිර්මාණය කිරීම කමිටුව ආරම්භයේ දී ඇති ප්‍රධාන ඉලක්කය වේ.

කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන අධ්‍යක්ෂ/ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2. වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය (සභාපති)
3. මහාචාර්ය ප්‍රියානි පීරිස් මිය - මහාචාර්ය – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
4. මහාචාර්ය ආර්. ඩී. එච්. කුලතුංග මිය - මහාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
5. වෛද්‍ය ටී. වීරරත්න
6. වෛද්‍ය කේ. පී. කේ. ආර්. කරුණාගොඩ මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
7. වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
8. වෛද්‍ය කේ. කේ. වී. එස්. පේෂලා මිය - කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

# 2. 2021 වර්ෂය තුළ දී අධ්‍යයන කටයුතු

## 2.1 වෛද්‍ය විශාරද ආයුර්වේද සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන්

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කටයුතු කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුව ද කිසිදු බාධාවකින් තොරව අඛණ්ඩව සිදු කරන ලදී. සියලුම ශිෂ්‍යයින් තමන් සඳහා වෙන් කළ පුහුණු මධ්‍යස්ථානවල දී විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි පුහුණුව සඳහා සහභාගී වූහ.

### 2.1.1. ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2021 වර්ෂය සඳහා නවක ශිෂ්‍යයින් ලියාපදිංචි නොකරන ලදී. කෙසේවුව ද, 2020 වර්ෂයේ දී ලියාපදිංචි කළ අභ්‍යාසලාභීන් 2021 වර්ෂයේ දී නව පුහුණු මධ්‍යස්ථාන සඳහා අවස්ථා දෙකක දී වෙන් කරන ලදී.

2021 වර්ෂයේ දී පහත දැක්වෙන විශේෂඥ විෂයන් පිළිබඳ වෛද්‍ය විශාරද පශ්චාත් උපාධි වැඩසටහන් පවත්වන ලදී.

1. වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘතය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද ආයුර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
3. වෛද්‍ය විශාරද ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර සහ ස්ත්‍රී රෝග සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
4. වෛද්‍ය විශාරද ආයුර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
5. වෛද්‍ය විශාරද ආයුර්වේද ස්වස්තවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

ඉහත පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත. (2021.12.31 වැනි දිනට)


| අධ්‍යයන වැඩසටහන | පූර්ණ කාලීන/ අර්ධ කාලීන | දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ලියාපදිංචි වී සිටින ශිෂ්‍යයින් සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | (2020 දෙසැම්බර් 31 වැනි දිනට) | | | (2021 දෙසැම්බර් 31 වැනි දිනට) | | |
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘතය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය | පූර්ණ කාලීන | | 1 | 1 | 1* | 1 | 2 |
| ආයුර්වේද කායචිකිත්සා වෛද්‍ය විශාරද ආයුර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය | පූර්ණ කාලීන | 6 | 8 | 14 | 5 | 8 | 13** |
| වෛද්‍ය විශාරද ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර සහ ස්ත්‍රී රෝග සහ අධ්‍යයන මණ්ඩල සහතිකය | පූර්ණ කාලීන | | 2 | 2 | | 2 | 2*** |
| වෛද්‍ය විශාරද ආයුර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය | පූර්ණ කාලීන | 1 | | 1 | 1 | | 1 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වෛද්‍ය විශාරද ආයුර්වේද ස්වස්තවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය | පූර්ණ කාලීන | | 1 | 1 | | 3 | 3 |
| මුළු එකතුව | | **7** | **14** | **21** | **7** | **14** | **21** |

***අංක 6 වගුව***

** 2021 පෙබරවාරි මාසයේ දී ලියාපදිංචි කරන ලදී (මාස 6ක් නිදහස් කර ඇත)*
*** අභ්‍යාසලාභීන් දෙදෙනෙක් පාඨමාලාව හැර ගිය අතර එක් අභ්‍යාසලාභියෙක් 2021 අගෝස්තු මාසයේ දී ලියාපදිංචි විය (වර්ෂ 1ක් නිදහස් කර ඇත)*
**** අභ්‍යාසලාභීන් දෙදෙනෙක් 2021 පෙබරවාරි මාසයේ දී ලියාපදිංචි වන ලදී (මාස 6ක් නිදහස් කර ඇත.)*


**විශේෂඥ ක්ෂේත්‍ර අනුව ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර**




***ප්‍රස්තාර අංක 1***

කෞමාරභෘතය කායචිකිත්සා ප්‍රසූතිතන්ත්‍ර ශල්‍යතන්ත්‍ර ස්වස්තවෘත

**ස්ත්‍රී-පුරුෂභාවය අනුව ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර.**




*2වැනි ප්‍රස්තාරය*

කෞමාරභෘතය කායචිකිත්සා ප්‍රසූතිතන්ත්‍ර ශල්‍යතන්ත්‍ර ස්වස්තවෘත

පුරුෂ ස්ත්‍රී

### 2.1.2 පුහුණු මධ්‍යස්ථාන, පුහුණුකරුවන් සහ පුහුණුවන්නන් පත් පිළිබඳ විස්තර

I වැනි වසර II අධ්‍යයන වාරය සහ II වැනි වසර I වැනි අධ්‍යයන වාරය සඳහා පුහුණුවන්නන් පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කිරීම 2021 වර්ෂයේ දී සිදු කරන ලද අතර ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

I වැනි අදියර II වැනි කොටස (2021.02.17 සිට 2021.08.16 දක්වා)

| අංකය | අභ්‍යාසලාභියාගේ නම | විශේෂඥ ක්ෂේත්‍රය | පුහුණු මධ්‍යස්ථානය | පුහුණුකරුගේ නම |
|---|---|---|---|---|
| 1 | වෛද්‍ය ජේ. ඒ. නිරෝෂා | කෞමාරභෘතය | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ඕ. ටී. එම්. ආර්. කේ. එස්. බී. කලවාන මිය |
| 2 | වෛද්‍ය ඩබ්ලිව්.ඒ.ආර්.පී. වීරසිංහ | කෞමාරභෘතය | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය |
| 3 | වෛද්‍ය ජේ. සී. ජයකොඩි | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | මහාචාර්ය එස්. එම්. එස්. සමරකොන් මහතා |
| 4 | වෛද්‍ය බී.ජී.එම්.කේ. රාජකරුණා මහත්මිය | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ඊ. ඩී. ටී. පී. ගුණරත්න මිය |
| 5 | වෛද්‍ය ඩී.එන්.ඩී.පී. සපරමාදු | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ආර්. ඩී. එච්. කුලතුංග මිය |
| 6 | වෛද්‍ය ආර්.ජේ. වැලිකල | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ආර්. ඩී. එච්. කුලතුංග මිය |

| | | | | |
|---|---|---|---|---|
| 7 | වෛද්‍ය එම්.අයි.ජේ. ජයකොඩි | කායචිකිත්සා | ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය | වෛද්‍ය කේ. ජී. සී. දිසානායක මිය |
| 8 | වෛද්‍ය කේ.පී.ඩී.සී. පෙරේරා මහත්මිය | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය සුධර්මා කොඩිතුවක්කු මිය |
| 9 | වෛද්‍ය කේ.කේ.අයි. එරංග | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය එස්. එම්. එස්. සමරකෝන් මහතා |
| 10 | වෛද්‍ය එස්.කේ.පී. වෛද්‍යාරත්න | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ඊ. ඩී. ටී. පී. ගුණරත්න මිය |
| 11 | වෛද්‍ය ඩබ්ලිව්.කේ. ජයරත්න | කායචිකිත්සා | පල්ලේකැලේ ආයුර්වේද රෝහල | වෛද්‍ය ටී. ජී. පුංචිහේවා මිය |
| 12 | වෛද්‍ය කේ. ඒ. එල්. එස්. කුරුප්පු ආරච්චි | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය එන්. ඩී. එන්. ජයවර්ධන මහතා |
| 13 | වෛද්‍ය වයි. ඩී. එස්. එස්. සුරවීර | කායචිකිත්සා | පල්ලේකැලේ ආයුර්වේද රෝහල | වෛද්‍ය ටී. ජී. පුංචිහේවා මිය |
| 14 | වෛද්‍ය පී. ආර්. ධර්මරත්න | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය වසන්ත සෝමරත්න මහතා |
| 15 | වෛද්‍ය කේ. එච්. එම්. එස්. පී. කේ. කස්තුරිසිංහ | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ආර්. එච්. එස්. කේ. ද සිල්වා මිය |
| 16 | වෛද්‍ය ඒ. එම්. එම්. පරනගම | කායචිකිත්සා | ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය | වෛද්‍ය කේ. ජී. සී. දිසානායක මිය |
| 17 | වෛද්‍ය එස්. එම්. ඩී. එන්. පී. සේනාරත්න | ප්‍රසූතිතන්ත්‍ර | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය වයි. ඒ. යූ. ඩී. කරුණාරත්න මිය |
| 18 | වෛද්‍ය ආර්. එන්. ඩී. පතිරන | ශල්‍යතන්ත්‍ර | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය |
| 19 | වෛද්‍ය බී. එල්. එදිරිසිංහ | ස්වස්තවෘත | NITM, BIMARI CMO අංශ | වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය |
| 20 | වෛද්‍ය ඒ. බී. ධර්මරත්න | ස්වස්තවෘත | NITM, BIMARI CMO අංශ | වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය |
| 21 | වෛද්‍ය එස්. ජී. පුංචිහේවා | ස්වස්තවෘත | NITM, BIMARI CMO අංශ | වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය |

**II වැනි අදියර I වැනි කොටස**

| අංකය | අභ්‍යාසලාභියාගේ නම | විශේෂඥ ක්ෂේත්‍රය | පුහුණු මධ්‍යස්ථානය | පුහුණුකරුගේ නම |
|---|---|---|---|---|
| 1 | වෛද්‍ය ජේ. ඒ. නිරෝෂා | කෞමාරභෘතය | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය |
| 2 | වෛද්‍ය ඩබ්ලිව්. ඒ. ආර්. පී. වීරසිංහ | කෞමාරභෘතය | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ඕ. ටී. එම්. ආර්. කේ. එස්. බී. කලවාන මිය |
| 3 | වෛද්‍ය ජේ. සී. ජයකොඩි | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ඊ. ඩී. ටී. පී. ගුණරත්න මිය |
| 4 | වෛද්‍ය ඩී. එන්. ඩී. පී. සපරමාදු | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය එන්. ඩී. එන්. ජයවර්ධන මහතා |
| 5 | වෛද්‍ය ආර්. ජේ. වැලිකල | කායචිකිත්සා | පල්ලේකැලේ ආයුර්වේද රෝහල | වෛද්‍ය ටී. ජී. පුංචිහේවා මිය |
| 6 | වෛද්‍ය එම්. අයි. ජේ. ජයකොඩි | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ආර්. ඩී. එච්. කුලතුංග මිය |

| | | | | |
|---|---|---|---|---|
| 7 | වෛද්‍ය කේ. පී. ඩී. සී. පෙරේරා මහත්මිය | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ඊ. ඩී. ටී. පී. ගුණරත්න මිය |
| 8 | වෛද්‍ය කේ. කේ. අයි. එරංග | කායචිකිත්සා | ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය | වෛද්‍ය කේ. ජී. සී. දිසානායක මිය |
| 9 | වෛද්‍ය එස්. කේ. පී. වෛද්‍යරත්න | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ආර්. එච්. එස්. කේ. ද සිල්වා මිය |
| 10 | වෛද්‍ය ඩබ්ලිව්. කේ. ජයරත්න | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | මහාචාර්ය එස්. එම්. එස්. සමරකෝන් මහතා |
| 11 | වෛද්‍ය කේ. ඒ. එල්. එස්. කුරුප්පු ආරච්චි | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | මහාචාර්ය එස්. එම්. එස්. සමරකෝන් මහතා |
| 12 | වෛද්‍ය වයි. ඩී. එස්. එස්. සූරවීර | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය එන්. ඩී. එන්. ජයවර්ධන මහතා |
| 13 | වෛද්‍ය පී. ආර්. ධර්මරත්න | කායචිකිත්සා | ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය | වෛද්‍ය කේ. ජී. සී. දිසානායක මිය |
| 14 | වෛද්‍ය ඩී. කේ. ආර්. කීර්තිරත්න | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය කේ. අයි. ඩබ්ලිව්. සෝමරත්න මහතා |
| 15 | වෛද්‍ය කේ. එච්. එම්. එස්. පී. කේ. කස්තුරිසිංහ | කායචිකිත්සා | පල්ලේකැලේ ආයුර්වේද රෝහල | වෛද්‍ය ටී. ජී. පුංචිහේවා මිය |
| 16 | වෛද්‍ය ඒ. එම්. එම්. පරනගම | කායචිකිත්සා | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය ආර්. එච්. එස්. කේ. ද සිල්වා මිය |
| 17 | වෛද්‍ය එස්. එම්. ඩී. එන්. පී. සේනාරත්න | ප්‍රසූතිතන්ත්‍ර | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය වයි. ඒ. යූ. ඩී. කරුණාරත්න මිය |
| 18 | වෛද්‍ය ආර්. එන්. ඩී. පතිරන | ශල්‍යතන්ත්‍ර | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය |
| 19 | වෛද්‍ය බී. එල්. එදිරිසිංහ | ස්වස්තවෘත | CMO අංශය, මහරගම, කොළඹ මහනගර සභාව පුහුණු ඒකක 1, BIMARI | වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය |
| 20 | වෛද්‍ය ඒ. බී. ධර්මරත්න | ස්වස්තවෘත | CMO අංශය කෝට්ටේ කොළඹ මහනගර සභාව පුහුණු ඒකක 2, BIMARI | වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය |
| 21 | වෛද්‍ය එස්. ජී. පුංචිහේවා | ස්වස්තවෘත | CMO අංශය, තිඹිරිගස්යාය, කොළඹ මහනගර සභාව පුහුණු ඒකක 3, BIMARI | වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය |

### 2.1.3 වෛද්‍ය විශාරද පශ්චාත් උපාධි වැඩසටහන් අනුමත කිරීම

සමාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පහත දැක්වෙන විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි පාඨමාලා අනුමත කර ඇත.

1. වෛද්‍ය විශාරද ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය,
2. වෛද්‍ය විශාරද ආයුර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
3. වෛද්‍ය විශාරද ආයුර්වේද ස්වස්තවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

මෙයට අමතරව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා පහත දැක්වෙන විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අයැදුම්පත්‍ර භාර දී ඇත.

1. වෛද්‍ය විශාරද ආයුර්වේද භයිසජ්‍යකල්පන සහ රාසශාස්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද ආයුර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

## 2.2 වෛද්‍ය විශාරද සිද්ධ සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන

### 2.2.1. වෛද්‍ය විශාරද පශ්චාත් උපාධි වැඩසටහන් අනුමත කිරීම

2020 වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ නිර්දේශය ඇතිව පහත දැක්වෙන සිද්ධ පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් දෙක සඳහා වූ අයදුම්පත්‍ර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

1. වෛද්‍ය විශාරද සිද්ධ ගුණපාඩම් පිළිබඳ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද සිද්ධ මරුතුවම් පිළිබඳ අධ්‍යයන මණ්ඩල සහතිකය

## 2.3 වෛද්‍ය විශාරද යුනානි සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන්

### 2.3.1. ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෛද්‍ය විශාරද යුනානි මෞලිජීත් සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීම පිණිස අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. යුනානි මෞලිජීත් පිළිබඳ වෛද්‍ය විශාරද උපාධි වැඩසටහන සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම පිණිස 2021 නොවැම්බර් මාසයේ දී තෝරා ගැනීමේ පරීක්ෂණය පවත්වන ලදී.

### 2.3.2 වෛද්‍ය විශාරද පශ්චාත් උපාධි වැඩසටහන් අනුමත කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2021 වර්ෂයේ දී පහත දැක්වෙන යුනානි විශේෂඥ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාව අනුමත කරන ලදී.

1. වෛද්‍ය විශාරද යුනානි මෞලිජීත් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

එමෙන්ම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ නිර්දේශය ඇතිව පහත දැක්වෙන යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් දෙක සඳහා වූ අයැදුම්පත්‍ර අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

1. වෛද්‍ය විශාරද යුනානි ඉල්මුල් අද්වියා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද යුනානි අම්රාස් ඊ නිස්වාන් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය.

# 3. පරිපාලන අංශ

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන වශයෙන් ආයතනයේ පරිපාලන අංශය සහ මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලැබේ. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය 2021 වසරේදී පිහිටුවන ලදී

### 3.1 පරිපාලන අංශය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන අංශය මඟින් සියලුම සාමාන්‍ය පරිපාලන කටයුතු සහ අධ්‍යයන කටයුතුවලට පහසුකම් සැලසීම පිළිබඳ ක්‍රියාකාරකම් පවත්වා ගෙන යනු ලැබේ. කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සහ වෙනත් රැස්වීම් පැවැත්වීම සඳහා පරිපාලන සහයෝගය ලබාදීම, කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ මෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ලේඛන ඉදිරිපත් කිරීම, අධ්‍යයන වැඩසටහන් සහ ශිෂ්‍ය අවශ්‍යතාවන් සම්බන්ධ ලේඛන පිළිබඳව අදාළ බලධාරීන් සමඟ කටයුතු කිරීම සමාලෝචිත වර්ෂය තුළ දී පරිපාලන අංශය මඟින් අධ්‍යයන කටයුතු ආශ්‍රිතව ඉටු කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

මෙයට අමතරව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය, අළුත්වැඩියා කටයුතු, ගොඩනැගිලි හා උපකරණ නඩත්තුව, කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා පොදු සේවාවන් සැපයීම, සේවා ප්‍රසම්පාදනය හා සන්නිවේදන පහසුකම් සැපයීම සහ ප්‍රවාහන සේවාවන් සැපයීම පරිපාලන අංශය මඟින් ඉටු කරන පරිපාලන කටයුතු අතර වේ. ස්ථිර පදනම මත එක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරියක්, එක් කළමනාකරණ සහකාරවරයෙක් සහ වැඩ සහායකවරයෙක් පරිපාලන අංශයේ 2021 වසර තුල සේවය කරන ලදී.

### 3.2 මූල්‍ය අංශය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මූල්‍ය පරිපාලන ආශ්‍රිත කටයුතු ඉටු කරනු ලබන අතර අයිතම ප්‍රසම්පාදනය, වාර්ෂික, කාර්තුමය හා මාසික අයවැය සකස් කිරීම, මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තා අදාළ බලධාරීන්ට යැවීම, ආයතනය මඟින් ලබා ගන්නා සියලුම සේවා සඳහා ගෙවීම් සිදු කිරීම, සුළු මුදල් කළමනාකරණය, චෙක්පත් නිකුත් කිරීම, වැටුප් ගෙවීම ආදී කටයුතු දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලබන ප්‍රධාන කටයුතු වේ.

මෙයට අමතරව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන අයිතම, ද්‍රව්‍ය, පොත්, වාරසඟරා ආදිය ප්‍රසම්පාදනය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලබයි. එක් ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරියක්, කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙක් සහ වැඩ සහායකවරයෙක් නිලධරයෙක් මූල්‍ය අංශයේ 2021 වසර තුල සේවය කරන ලදී.

### 3.3 පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත තොරතුරු සොයා ගැනීමට සහ දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳව අනර්ඝ තොරතුරු කේන්ද්‍රස්ථානය බවට පත්වීමට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සැලසුම් කරයි. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය 2021 වර්ෂයේ දී සහකාර පුස්තකාලයාධිපතිවරයෙක් බඳවා ගැනීමත් සමඟ ආරම්භ කරන ලදී. 2021 වර්ෂයේ දී පුස්තකාල කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇත. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය සඳහා අදාළ ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි සකස් කරමින් පවතී. පුස්තකාලයේ ක්‍රියාත්මක වීම පිණිස යටිතල පහසුකම් සංවර්ධනය අත්‍යවශ්‍ය අංගයක් වන බැවින් පුස්තකාලය සඳහා කාර්යාලයීය

උපකරණ සහ පොත්පත් ලබා ගැනීම මේ වන විට සිදු කරමින් ඇත. පුස්තකාලය අනාගතයේ දී විද්‍යුත්-පුස්තකාලයක් සහ ඩිජිටල් ගබඩාවක් ඇති කිරීමට ද ඉලක්ක කර ඇත. ඒ අනුව මෙම පුස්තකාලය නූතන ලෝකයේ දක්නට ලැබෙන නම්‍යශීලී පුස්තකාල සංකල්පය අනුව දෙමුහුන් පුස්තකාලයක් බවට පත් වනු ඇත. එමෙන්ම ආයතනය තුළ දැනට පවතින ඉඩකඩ කළමනාකරණය කරමින් පුහුණුවන්න්න් සඳහා කියවීම් පහසුකම් ඉහළ නැංවීම පිණිස ද සැලසුම් කරයි. ඒ අනුව අප අපගේ ප්‍රමුඛතා සේවා පවත්වා ගැනීම පිණිස වෙනත් විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ හවුල්කාරත්වයන් ඇති කර ගැනීමට කටයුතු සැලසුම් කරන්නෙමු.

වර්තමානය වන විට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පශ්චාත් උපාධි අධ්‍යයන ශිෂ්‍යයන් 21 දෙනෙක් සඳහා සේවය සපයන අතර ඔවුන් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලයේ සේවය ලබයි. පුස්තකාලය සඳහා පළමු වැනි ග්‍රන්ථ එකතුව ලෙස මුද්‍රිත පොත් 350කට අධික සංඛ්‍යාවක් ලැබීමට නියමිත වේ. භෞතික ග්‍රන්ථ එකතුව පරිශීලකයින් සඳහා විවෘත කිරීමට කටයුතු සූදානම් කරමින් ඇත. අපි කොළඹ විශ්වවිද්‍යාලයේ පිහිටි ජාතික ඩිජිටල් පුස්තකාල සමූහයෙන් සුදුසු විද්‍යුත්-පුස්තකාල දත්තසමුදායන් ඉල්ලා සිටින ලද අතර ඒ සඳහා කටයුතු ඉටු කරමින් පවතී. පුහුණුවන්නන්ගේ පර්යේෂණ වාර්තාවල රචනා සොරකම (Plagiarism) සෝදිසි කිරීම සඳහා අවශ්‍ය කරන TURNITIN මෘදුකාංගය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇත. පුස්තකාල පුහුණු වැඩසටහන ආරම්භ කිරීම මඟින් පුස්තකාල විද්‍යා උපාධි අපේක්ෂකයන් සඳහා පුහුණු අවස්ථා සලසා ඇති අතර මේ වන විට ආධුනික පුහුණුවන්නන් දෙදෙනෙක්ගේ සේවය ලබා ගෙන ඇත. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය එහි පරිශීලකයන් සඳහා ප්‍රමාණවත් තොරතුරු සේවා සැපයීම පිණිස දේශීය වෛද්‍ය විද්‍යා ආශ්‍රිත සම්පත් මධ්‍යස්ථාන සහ HELLIS සහ SLISTINET ජාල සමඟ සහයෝගීතා ගොඩනඟා ගැනීමට සැලසුම් කරයි. පුස්තකාල වෙබ් අඩවිය සැලසුම් අදියරේ පවතින අතර එම වෙබ් අඩවිය නිර්මාණය කිරීම අවසන් කළ විට එය අදාළ විද්‍යුත්- දත්තසමුදායන්ට සහ වෙනත් පරිශීලක තොරතුරු අවශ්‍යතාවන්ට සම්බන්ධ කරනු ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය අදාළ විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ලබා ගත හැකි සම්පත් හුවමාරු කර ගැනීමටත් පරිශීලකයන්ගේ තොරතුරු අවශ්‍යතාවන් හඳුනා ගනිමින්, ඔවුන් සඳහා වඩාත් විශිෂ්ට සේවාවක් සැපයීමටත් එමෙන්ම අදාළ ක්ෂේත්‍රවල ප්‍රකාශයට පත් කර ඇති තොරතුරු සම්පත් වඩාත් විශිෂ්ට ලෙස භාවිතා කිරීමටත් අපේක්ෂා කරනු ලබයි.

# 4. මානව සම්පත් දත්ත

2021 වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස පියවර ගෙන ඇත. අධ්‍යක්ෂ ධූරය සඳහා පැවති පුරප්පාඩුව පිරවීමට හැකිවීම විශාල ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. තව ද, සමාලෝචිත වර්ෂය තුළ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එහි පැවති පුරප්පාඩු කිහිපයක්ම සම්පූර්ණ කළ හැකි විය. සහකාර පුස්තකාලයාධිපතිවරයෙක්, කළමනාකරණ සහකාර නිලධාරීන් හතර දෙනෙක් සහ එක් අභ්‍යාසලාභී තාක්ෂණික නිලධාරියෙක් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පවතින සීමිත භෞතික සහ මානව සම්පත වෙනුවෙන් බඳවා ගන්නා ලදී. ඒ අනුව පැවරුම් පදනම මත ආයතනයේ සේවයට බඳවා ගත් කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙක්ගේ සේවය නිමා කරන ලදී.

කළමනාකරණ සහකාර (පොත් තැබීම) තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර 2021 නොවැම්බර් මාසයේ දී තෝරා ගැනීමේ පරීක්ෂණය පවත්වන ලදී.

කෙසේවුව ද, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් කළමනාකරණ සහකාර (ශ්‍රේණිය III) තනතුර සඳහා යෝග්‍ය නිලධාරීන් බඳවා ගැනීම පිණිස තෝරා ගැනීමේ පරීක්ෂණයක් සහ තෝරා ගැනීමේ සම්මුඛ සාකච්ඡාවක් දෙසැම්බර් මාසයේ දී සිදු කරන ලදී. ඒ අනුව කළමනාකරණ සහකාර නිලධාරීන් තිදෙනෙක් එම තනතුරුවල වැඩභාරගන්නා ලදී. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා සේවක මණ්ඩල අවශ්‍යතාව අධ්‍යයන සහ පරිපාලන කටයුතු සාර්ථකව ඉටු කිරීමේ දී මුහුණ දෙන ප්‍රධාන අභියෝගයකි.

### 4.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධරයන් 16ක් වන අතර 2021.12.31 වැනි දිනට සේවක සංඛ්‍යා විස්තරය පහත දැක්වෙන පරිදි වේ:

**අනුමත සේවක සංඛ්‍යාව සහ 2021 දෙසැම්බර් මස 31 වැනි දිනට සිටින වර්තමාන කාර්යමණ්ඩලය - සියලුම කාර්ය මණ්ඩලය**

| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| වැඩ සහායක | UWAS | III/II/I/Spl | U - PL 1 | ප්‍රාථමික | 2 | 0 | **2** |
| රියැදුරු | UDS | III/II/I/Spl | U - PL 3 | ප්‍රාථමික | 3 | 0 | **3** |
| කළමනාකරණ සහකාර (පොත් තැබීම) | UMAS | III/II/I | U - MN 1 | ද්විතීය | 1 | 0 | **0** |
| කළමනාකරණ සහකාර | UMAS | III/II/I | U - MN 1 | ද්විතීය | 5 | 3 | **2** |
| තාක්ෂණික නිලධාරී | UTS | III/II/I | U-MT 1 | ද්විතීය | 1 | 1 | **0** |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | UA සහ FS | II/I | U-EX 2 | ජ්‍යෙෂ්ඨ | 1 | 1 | **0** |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | UAසහFS | II/I | U-EX 2 | ජ්‍යෙෂ්ඨ | 1 | 1 | **0** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සහකාර පුස්තකාලයාධිපති | අධ්‍යයන | | U-AC 3 | ජ්‍යෙෂ්ඨ | 1 | 1 | **0** |
| අධ්‍යක්ෂ | අධ්‍යයන | | U-AC 5 | ජ්‍යෙෂ්ඨ | 1 | 1 | 0 |
| **එකතුව** | | | | | **16** | **8** | **7** |

* බහු කාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර ඇත.

## 5. 2021 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය

**දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| දෙසැම්බර් මස **31**වැනි දිනට | සටහන අංකය | **2021** රු. | **2020** රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | **3** | 16,396,756 | 14,024,586 |
| ස්ථිර තැන්පතුවල ආයෝජනය | **4** | 3,439,604 | 1,500,000 |
| ලැබිය යුතු දෑ | **5** | 357,080 | 4,283 |
| කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් | **6** | 132,900 | 155,400 |
| අත්තිකාරම් | **7** | 19,132 | - |
| තොග | **8** | 463,551 | 95,635 |
| මුළු ජංගම වත්කම් | | 20,809,023 | 15,779,903 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් | **6** | 201,267 | 331,667 |
| දේපළ, පිරියත හා උපකරණ (ශුද්ධ) | **9** | 5,318,004 | 5,629,510 |
| මුළු ජංගම නොවන වත්කම් | | 5,519,271 | 5,961,176 |
| **මුළු වත්කම්** | | **26,328,294** | **21,741,079** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | **10** | 3,804,182 | 2,878,956 |

| | | | |
|---|---|---|---|
| ගෙවිය යුතු දෑ | **11** | 1,022,350 | 930,670 |
| විලම්භිත ආදායම | | 525,000 | 1,341,667 |
| මුළු ජංගම වගකීම් | | 5,351,532 | 5,151,292 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | **12** | 1,505,304 | 1,369,603 |
| මුළු ජංගම නොවන වගකීම් | | 1,505,304 | 1,369,603 |
| **මුළු වගකීම්** | | **6,856,836** | **6,520,895** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **19,471,457** | **15,220,184** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | |
| වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | **13** | 3,490,305 | 3,469,477 |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | **14** | 4,887,453 | 2,422,248 |
| MOHE වලින් ප්‍රාග්ධන ප්‍රදාන | **15** | 8,047,199 | 8,403,288 |
| සමුච්චිත අතිරික්තය /(හිඟය) | **16** | 3,046,499 | 925,170 |
| **මුළු ශුද්ධ වත්කම්/සමකොටස්** | | **19,471,457** | **15,220,184** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය නිකුත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස් කර, ඉදිරිපත් කර ඇත.

| | |
|---|---|
| …………………………………. | …………………………………… |
| සී.පී. හතරසිංහ | ඩබ්ලිව්.එන්.පී.එම්.එන්.එන්. කරුණාරත්න |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් වගකිව යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය මඟින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

……………………………………..
මහාචාර්ය ක්‍රිශාන්ත අබේසේන
අධ්‍යක්ෂ

| | |
|---|---|
| …………………………………….. | …………………………… |
| ටී. ධර්මරාජා | ජේ. එච්. ප්‍රනාන්දු |
| කළමනාකරණ මණ්ඩලයේ සාමාජික | කළමනාකරණ මණ්ඩලයේ සාමාජික |

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් නිරූපණය වේ. 28 වැනි පිටුව සිට 44වැනි පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

*ඉංග්‍රීසි පිටපටතෙහි අත්සන් සඳහන් කර ඇත.

**දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය**

**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය**

| **දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා** | සටහන අංකය | **2021** රු. | **2020** රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| භාණ්ඩාගාරයෙන් ලැබූ පුනරාවර්තන ප්‍රදාන | | 19,777,000 | 12,851,000 |
| උත්පාදිත ආදායම | **17** | 2,991,000 | 1,086,333 |
| වෙනත් ආදායම | **18** | 268,647 | 255,465 |
| ක්‍රමක්ෂය ආදායම් | **19** | 870,055 | 825,584 |
| **මුළු ආදායම** | | **23,906,702** | **15,018,382** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| සේවක පඩිනඩි | **20-A** | 15,756,573 | 7,809,970 |
| ගමන් සහ යැපීම් දීමනාව | **20-B** | 90,302 | 32,181 |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | **20-C** | 525,074 | 375,752 |
| නඩත්තු වියදම් | **20-D** | 74,446 | - |
| කොන්ත්‍රාත් සේවා | **20-E** | 2,342,167 | 2,947,201 |
| වෙනත් පුනරාවර්තන වියදම් | **20-F** | 2,126,755 | 1,655,994 |
| ක්ෂයවීම් | **20-G** | 870,055 | 825,584 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **21,785,374** | **13,646,682** |
| **කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/හිඟය** | | **2,121,329** | **1,371,700** |

**දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය**

**හිමිකම්/ ශුද්ධ වත්කම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය**

**2021 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(රු.)

| | සමුච්චිත අරමුදල | වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන | එකතුව |
|---|---|---|---|---|---|
| 2020 ජනවාරි මස 01වැනි දිනට ශේෂය | (446,530) | 2,718,626 | 3,142,594 | 8,759,378 | 14,174,068 |
| ප්‍රදාන ක්‍රමක්ෂය | - | (469,495) | - | (356,089) | (825,584) |
| ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන | - | - | 500,000 | - | 500,000 |
| වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | - | 1,220,346 | (1,220,346) | - | - |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිගය) | 1,371,700 | - | - | - | 1,371,700 |
| **2020 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය** | **925,170** | **3,469,477** | **2,422,248** | **8,403,288** | **15,220,184** |
| ප්‍රදාන ක්‍රමක්ෂය | - | (513,966) | - | (356,089) | (870,055) |
| ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන | - | - | 3,000,000 | - | 3,000,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | - | 534,795 | (534,795) | - | - |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිගය) | 2,121,329 | - | - | - | 2,121,329 |
| **2021 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය** | **3,046,499** | **3,490,305** | **4,887,453** | **8,047,199** | **19,471,457** |

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලය**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| **දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්(භාවිතා කළ) මූල්‍ය ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය) | 2,121,329 | 1,371,700 |
| *ගැලපීම්* | | |
| **මූල්‍ය නොවන සංචලන** | | |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම | 870,055 | 825,584 |
| පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම | 135,701 | 930,827 |
| පොලී ආදායම | (246,122) | (228,267) |
| ප්‍රදාන ක්‍රමක්ෂය | (870,055) | (825,584) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය)** | **2,010,908** | **2,074,261** |
| බඩු තොගවල වැඩිවීම/ අඩුවීම | (367,916) | 21,498 |
| ජංගම වත්කම්වල වැඩිවීම/අඩුවීම | (371,482) | - |
| ජංගම වගකීම්වල වැඩිවීම / අඩුවීම | 96,484 | 2,635,938 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | **1,367,994** | **4,731,697** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් /(භාවිතා කළ) මූල්‍ය ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම | (454,795) | (1,206,746) |
| කාර්ය මණ්ඩලයට ණය ගෙවීම් | - | (287,400) |
| කාර්ය මණ්ඩලයෙන් ණය ආපසු අය කර ගැනීම් | 152,900 | 140,333 |
| ස්ථිර තැන්පතුවල ආයෝජනය | (1,870,000) | (1,500,000) |
| අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොලී ආදායම | 176,071 | 223,984 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතා කළ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | **(1,995,824)** | **(2,629,828)** |

**<u>මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ</u>**

| | | |
|---|---|---|
| වසර සඳහා ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන | 3,000,000 | 500,000 |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | **3,000,000** | **500,000** |
| | | |
| **මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම /(අඩුවීම)** | 2,372,170 | 2,601,869 |
| වසර ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | 14,024,586 | 11,422,717 |
| **වසර අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | **16,396,756** | **14,024,586** |
| | | |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| මුදල් සහ බැංකු ශේෂ (සටහන 3) | **16,396,756** | **14,024,586** |

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
**කොළඹ විශ්වවිද්‍යාලය**
**මූල්‍ය සාධනයේ අයවැය සමඟ සංසන්දනාත්මක ප්‍රකාශනය**

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2021 තථ්‍ය රු. | 2021 අයවැය රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| භාණ්ඩාගාරයෙන් ලැබුනු පුනරාවර්තන ප්‍රදාන | | 19,777,000 | 40,000,000 |
| උත්පාදිත ආදායම | **17** | 2,991,000 | 2,000,000 |
| වෙනත් ආදායම | **18** | 268,647 | - |
| ආදායම ක්‍රමක්ෂය | **19** | 870,055 | - |
| **මුළු ආදායම** | | **23,906,702** | **42,000,000** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| සේවක පඩිනඩි | **20-A** | 15,756,573 | 27,000,000 |
| ගමන් සහ යැපීම් දීමනාව | **20-B** | 90,302 | 700,000 |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | **20-C** | 525,074 | 1,700,000 |
| නඩත්තු වියදම් | **20-D** | 74,446 | 195,000 |
| කොන්ත්‍රාත් සේවා | **20-E** | 2,342,167 | 5,965,000 |
| වෙනත් පුනරාවර්තන වියදම් | **20-F** | 2,126,755 | 6,440,000 |
| ක්ෂයවීම | **20-G** | 870,055 | - |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **21,785,374** | **42,000,000** |
| **කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)** | | **2,121,329** | **-** |

**දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

කොළඹ විශ්වවිද්‍යාලය

2021 දෙසැම්බර් මස **31**වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**1. සාමාන්‍ය තොරතුරු**

**1.1 නෛතික සහ ආයතනික ස්ථාපනය**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 ඒ වගන්තිය සමඟ කියවිය යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2017 අංක 05 දරන ආඥා පනතේ 18 වැනි වගන්තිය මඟින් පිහිටුවන ලද අතර 2017 අංක 2031/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. විද්‍යායතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වන අතර ආඥා පනතේ විස්තර කළ 2019 පෙබරවාරි මස එහි කටයුතු ආරම්භ කරන ලදී. විද්‍යායතනයේ කාර්යාලය බොරැල්ල, කොටා පාර, ආයුර්වේද ශික්ෂණ රෝහලේ 5වැනි මහළේ තාවකාලිකව ස්ථාපනය කර ඇත.

2021 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය 2022 පෙබරවාරි මස 18 වැනි දින පැවති කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**1.2 මූල්‍ය කාලපරිච්ඡේදය**

ආයතනයේ මූල්‍ය කාලපරිච්ඡේදය 2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වේ.

**1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය**

(අ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව මඟින් අනුමත කරන පරිදි ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි උපදේශනය, පුහුණුව සහ පර්යේෂණ සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීම සහ එම සේවා සැපයීම.

(ආ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය සහ කොමිෂන් සභාවේ එකඟතාව ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම හෝ අදාළ විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ වෙනත් අධ්‍යයන විශිෂ්ටතා පිරිනැමීමට තීරණය කිරීම.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම හෝ අදාළ විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥතා අත්කර ගත් තැනැත්තන් තීරණය කිරීමේ කාර්ය සඳහා පශ්චාත් උපාධි පර්යේෂණ පැවැත්වීම සහ පර්යේෂණ සමත්ව සිටින සහ ආයතනයේ අදහස් විමසා, විශ්වවිද්‍යාලය මඟින්

නියම කරන අනු-නීති අනුව වෙනත් කොන්දේසි සපුරා ඇති, ඒ අනුව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ වෙනත් අධ්‍යයන විශිෂ්ටතා ප්‍රදානය කිරීමට සුදුසුකම් සපුරාලන තැනැත්තන් පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම.

(ඈ) ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් විශ්වවිද්‍යාලය හෝ ආයතන සමඟ ගුරු, ශිෂ්‍ය සහ විද්වතුන් හුවමාරු කර ගැනීම හෝ වෙනත් ආකාරයකින් සහයෝගීතා ඇති කර ගැනීම.

## 1.4 කෙරී ගෙන යන වැඩ

මූල්‍ය ප්‍රකාශන කෙරී ගෙන යන වැඩ පදනම මත සකස් කර ඇත.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

### 1.5.1 අනුකූලතා ප්‍රකාශනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මඟින් නිකුත් කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය, සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී යොදා ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

### 1.5.2 තක්සේරු කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝග්‍ය අවස්ථාවල දී අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම් සම්බන්ධයෙන් යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

### 1.5.3 තුලනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා සහ සංසන්දනාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම මුදල් ප්‍රමාණයන් සඳහා පෙර කාලසීමාව සම්බන්ධයෙන් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ.

### 1.5.4. වැදගත්භාවය සහ සමූහනය

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ කාර්යයන් ඇති අයිතම වැදගත් නොවන්නේ නම් මිස වෙනම ඉදිරිපත් කර ඇත.

### 1.5.5. හිලව් කිරීම

SLPSAS මඟින් අවශ්‍ය කර හෝ අවසර දී ඇත්තේ නම් මිස වත්කම් හා වගකීම් සහ ආදායම හා වියදම හිලව් කිරීම සිදු කර නොමැත.

### 1.5.6. වාර්තාකරණ දිනයට පසු සිදුවීම්

වාර්තා කරන දිනයට පසුව එළැඹෙන සියලුම වැදගත් සිදුවීම් සලකා බලන ලදුව අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල නිසි ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

### 1.5.7. කෘත්‍ය සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය

මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයේ ඉදිරිපත් කිරීමේ සහ ව්‍යවහාර මුදල් වර්ගය වන "ශ්‍රී ලංකා රුපියල්" (Rs.) වලින් සකස් කර ඉදිරිපත් කර ඇත.

### 1.5.8. වටැයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකට දක්වා ඇත්තේ නම් මිස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් ආසන්න රුපියලට වටයා ඇත.

### 1.5.9. වැදගත් ගිණුම්කරන ඇස්තමේන්තු සහ තීන්දු

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ වැදගත් තීන්දුවල කිසියම් වෙනස්කමක් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 2.1 ජංගම වත්කම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් මූල්‍ය ප්‍රකාශනයේ දිනයෙන් වසරක් ඇතුළත ආපසු අය කර ගනු ලැබේ.

### 2.1.1 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ, අතැති මුදල්, බැංකු ශේෂ සහ කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ. 2019 වසරේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු රුපියල් 7,000,000.00 ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස 2019 වසරේ අරමුදල් කළමනාකරණ ගිණුමට මාරු කර ඇති අතර, වත්මන් මූල්‍ය වර්ෂය තුළ උපයා ඇති පොලිය රුපියල් 176,071/- කි.

### 2.1.2 ස්ථිර තැම්පතුවල ආයෝජනය

2020 මුදල් වර්ෂය තුළ අභ්‍යන්තර ආදායමෙන් රුපියල් 1,500,000.00 ක් මාස තුනක ස්ථාවර තැන්පතුවල රුපියල් 500,000.00 බැගින් ආයෝජනය කර ඇත. රුපියල් 1,870,000/- ක අභ්‍යන්තර ආදායම වත්මන් මූල්‍ය වර්ෂය තුළ වසරක ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත. 2021 වර්ෂය සඳහා ඉහත ආයෝජනයෙන් උපයන පොලිය රු.70,051/- කි.

### 2.1.3 භාණ්ඩ ලේඛන සහ තොග

භාණ්ඩ ලේඛන පිරිවැය අඩු සහ ශුද්ධ හඳුනාගැනීමේ වටිනාකමට දක්වා ඇත. සාමාන්‍යයෙන් පිරිවැය පළමුව එන පළමුව යන පදනමට තීරණය කරනු ලබන අතර භාණ්ඩ ලේඛන අත්කර ගැනීමට දැරූ වියදම සහ ඒවා පවතින තත්ත්වයට හා ස්ථානයට ගෙන ඒමට දැරූ වියදම ඇතුළත් වේ.

ලිපි ද්‍රව්‍ය හා වෙනත් පාරිභෝගික අයිතම ආයතනයේ බඩු ලේඛනවලට ඇතුළත් වේ.

## 2.2 ජංගම නොවන වත්කම්

### 2.2.1 දේපළ, පිරියත හා උපකරණ

කාර්යාල හා ඉගැන්වීම් උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්, පරිගණක හා පරිගණක මෙවලම් සහ වෙනත් වත්කම් රජයේ ප්‍රදානවලින් අත්කර ගත් අයිතමවලට ඇතුළත් වේ.

කොළඹ විශ්වවිද්‍යාලය 2018 වසරේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබූ මූලික ප්‍රදානවලින් ආයතනය සඳහා රු. 2,264,892.50 ක් වටිනා අයිතම මිල දී ගෙන ඇත. මෙම වත්කම් 2018 වසරේ දී කොළඹ විශ්වවිද්‍යාලය මඟින් ඔවුන්ගේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ප්‍රාග්ධනය කර ඇත. තව ද කොළඹ විශ්වවිද්‍යාලය 2018 වසර සඳහා සමුච්චිත ක්ෂයවීම් ලෙස රු. 149,425.53ක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව, 2019.01.01 වැනි දින වන විට ආයතනය මඟින් රු. 2,115,466.97 ක වටිනාකම ඇති වත්කම් ඒවායේ ශුද්ධ ලිඛිත වටිනාකම පදනම්ව හඳුනා ගෙන, ප්‍රාග්ධනය කර ඇති අතර අදාළ ප්‍රදානය වත්කම්වල ඉතිරි ප්‍රයෝජනවත් ජීවිත කාලය අතරතුර ක්‍රමක්ෂය කර ඇත.

**අ) හඳුනා ගැනීමේ සහ මැනීමේ පදනම**

දේපළ, පිරියත හා උපකරණවල අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැක්කේ නම් හඳුනා ගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂයවීම් ලෙස වාර්තා කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය ඒවා මිල දී ගැනීමේ පිරිවැය සහ ඒවා සම්බන්ධ ආනුශංගික විදයම්වල එකතුව වේ.

සියලුම දේපළ, පිරියත හා උපකරණ ආරම්භයේ දී පිරිවැයට දක්වන අතර පසුව පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂයවීම සහ කිසියම් අපවයවීම් අලාභ ආදියට මනිනු ලැබේ. අළුත්වැඩියා කිරීමේ සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද ආකාරයට විස්තීරණ ආදායම ප්‍රකාශනයේ දක්වා ඇත.

**ආ) මූලික පිළිගැනීම**

වත්කම් එහි ස්වභාවය මත ප්‍රාග්ධනිත කර ඇත. සැලකිය යුතු පිරිවැයක් සහිත, වසරකට වඩා වැඩි කාලයක් පවතින ස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු ලැබේ. වත්කමේ ජීවිත කාලය වසර 5 සිට වසර 20 දක්වා එහි කාණ්ඩය අනුව රඳා පවතී.

**ඇ) පවතින ස්ථාවර වත්කම්වල පසුකාලීන පිරිවැය**

ස්පර්ශනීය, ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් දැරූ වියදම පහත දැක්වෙන නිර්ණායක සපුරාලන්නේ නම් මිස ඒවා දැරූ කාලපරිච්ඡේදය තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇති අතර අදාළ පදනම මත ප්‍රාග්ධනය කොට, ක්ෂය කරනු ලැබේ.

- ස්ථාවර වත්කම්වල වෙළඳපොළ වටිනාකම පසුව වැඩි කර ඇත
- වත්කම් ධාරිතාව ඉහළ දැමීම.
- නිමැවුමේ ගුණාත්මකභායේ තිරසර වැඩිදියුණු කිරීම හෝ මෙහෙයුම් පිරිවැයේ අඩුවීම.
- අළුත්වැඩියා කිරීම සහ නඩත්තුව මඟින් තහවුරු කර ඇති කාලසීමාව ඉක්මවා වත්කමේ ජීවිත කාලය සැලකිය යුතු ලෙස දීර්ඝ කිරීම.

ඇ) **ක්ෂයවීම**

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රයෝජනය සඳහා පත් කළ දිනයේ සිට ඒවායේ ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට සරල රේඛීය පදනම මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත. ඉඩම් ක්ෂය කරනු නොලැබේ. ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලපරිච්ඡේදයන් පහත දැක්වෙන පරිදි වේ.

| **විස්තරය** | **ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය** |
|---|---|
| කාර්යාල හා ඉගැන්වීම් උපකරණ | වසර 10 |
| පරිගණක හා පරිගණක මෙවලම් | වසර 5 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | වසර 10 |

ක්ෂයවීම් භාවිතා කළ කාලපරිච්ඡේදය මත පදනම්ව, මිල දී ගත් දින සිට අපහරණ දිනය දක්වා දක්වා ඇත. කොළඹ විශ්වවිද්‍යාලයෙන් මාරු කළ වත්කම් එම විශ්වවිද්‍යාලය මඟින් 2018 දෙසැම්බර් මස 31වැනි දින දක්වා ක්ෂය කර ඇති බැවින් 2019.01.01 දින සිට ක්ෂය කරනු ලැබේ.

### 2.3 වගකීම් සහ ප්‍රතිපාදන

#### 2.3.1 ජංගම වගකීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් නම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයේ සිට වසරක කාලයක් තුළ ගෙවීමට ඇති වගකීම් වේ. දන්නා සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ගණනය කර ඇත.

#### 2.3.2 විලම්භිත ආදායම

පාඨමාලා සහ අධ්‍යයන වැඩසටහන්වලට අදාළ ලැබීම් පාඨමාලා ආරම්භයේ දී එක්රැස් කරන විට සහ පාඨමාලා පැවැත්වීම මාස කිහිපයක කාලපරිච්ඡේදයකින් සිදු කරන විට විලම්භිත ආදායම ඇති වේ. පාඨමාලාව පවත්වනු ලබන කාලසීමාව දක්වා විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනයේ දී ආදායම හඳුනා ගන්නා අතර පාඨමාලාවේ ඉතිරි කාලපරිච්ඡේදයට අදාළ ශේෂය, ආදායම හඳුනා ගන්නා තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වගකීමක් ලෙස විලම්භිත ආදායම ලෙස හඳුනා ගනී.

#### 2.3.3 විශ්‍රාම ප්‍රතිලාභ සඳහා විධිවිධාන

**සේවක ප්‍රතිලාභ**

**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිකය**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සේවකයෙක් විශ්‍රාම යන විට ලැබෙන ප්‍රතිලාභ අගය ඇස්තමේන්තු කරනු ලබයි. 1983 අංක 12 දරන පාරිතෝශික දීමනා ගෙවීම් පනත යටතේ විශ්වවිද්‍යාලය මඟින් ප්‍රතිලාභ සැලැසුම භාවිතා කරනු ලැබේ.

එය සේවකයාගේ වයස, සේවා කාලය සහ වන්දි යන සාධක මත තීරණය වේ. මෙම වගකීම සපුරාලීම සඳහා අභ්‍යන්තර කළමනාකරණ ඇගයීම මත පදනම්ව ගණනය කළ අගය වාර්තා කරන දිනයට විධිවිධානයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, වාර්තා කරන දිනට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා වගකීම හඳුනා ගන්නා ලදී. කාලපරිච්ඡේදය ආරම්භයේ දී ඉදිරියට ගෙන ආ විධිවිධාන සහ කාලපරිච්ඡේදය අවසානයේ දී ඉදිරියට ගෙන ආ විධිවිධින අතර වෙනස ලාභය සහ අලාභය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

පරතෝෂිත වගකීම සඳහා බාහිරින් අරමුදල් සැපයීම හෝ ජීවගණක තක්සේරුවක් සිදු නොවේ.

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්**

නිශ්චිත දායකත්ව සැලසුම ආයතනයක් විසින් වෙනස් ආයතනයක් වෙත ස්ථාවර දායකත්වයක් ගෙවනු ලබන පසු-සේවානියුක්ති සැලසුමක් වන අතර වැඩිපුර අගයක් ගෙවීම සඳහා කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නොමැත. නිශ්චිත දායකත්ව සැලසුම්වලට දායකත්වය ගෙවීම සඳහා වූ බැඳීම ඒවා ගෙවිය යුතු අවස්ථාවල දී විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස දක්වා ඇත.

**විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) සහ විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල**

ශ්‍රී ලංකාවේ ඇති අදාළ ව්‍යවස්ථා, නීති සහ විශ්වවිද්‍යාල පනත අනුව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා ආයතනය විසින් 15%ක දායකත්වයක් සහ සේවකයින් විසින් ඔවුන්ගේ දළ වැටුපෙන් 7% සහ 10% ලෙස දායකත්වය දක්වයි. එමෙන්ම විශ්වවිද්‍යාලය විශ්‍රාම යන සේවකයින් වෙනුවෙන් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලය 8%ක දායකත්වයක් ද දක්වයි .

**සේවක ප්‍රතිලාභ සේවක භාරකාර අරමුදල (ETF)**

විශ්වවිද්‍යාලය සෑම සේවකයෙක්ගේම දළ වැටුපෙන් 3%ක් සේවක භාරකාර අරමුදලට දායකත්වය දක්වයි.

**2.3.4 අසම්භාව්‍ය බැරකම්**

නඩු කටයුතුවලින් ඇති වූ වගකීම් සම්බන්ධයෙන් කිසිදු විධිවිධානයක් ගිණුම්ගත කර නොමැත. 2021 දෙසැම්බර් මස 31වැනි දිනට ඇති ඇස්තමේන්තුගත සියලුම වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

**2.4 සමකොටස්**

**2.4.1 ප්‍රාග්ධන ප්‍රදාන**

රජයේ ප්‍රදාන ලැබීමේ සහ සියලුම කොන්දේසිවලටඅනුකූලවීමේ යුක්තිසහගත සහතිකවීම මත රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා වූ රජයේ ප්‍රදාන සහ වෙනත් සංවිධානවලින් ලැබෙන දායකත්වය පළමු වැනි අවස්ථාවේ දී ලැබූ ප්‍රදාන ලෙස සලකනු ලැබේ. වත්කම් මිල දී ගැනීම සඳහා උපයෝජනය කර ගැනීම මත ඒවා වැය නොකළ ප්‍රාග්ධන ගිණුමට ඇතුළත් කරන අතර එසේ නැතහොත් වියදම් කළ වත්කම් මිල දී ගැනීම සඳහා ආදායමට හෝ වියදමට ඇතුළත් කරනු ලැබේ.

### 2.4.2 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මුදල් පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. වාර්තාකරණ මූල්‍ය වර්ෂවලදී ලැබුණු පුනරාවර්තන ප්‍රදාන පහත දක්වා ඇත.

| වසර | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| පුද්ගලික දීමනා | 15,413,000.00 | 8,775,000.00 |
| වෙනත් පුනරාවර්තන | 4,364,000.00 | 4,076,000.00 |
| මුළු පුනරාවර්තන ප්‍රදානය | 19,777,000.00 | 12,851,000.00 |

**ප්‍රදාන සඳහා ගිණුම්ගත කිරීම**

විශ්වවිද්‍යාලය දරනු ලබන වියදම් සඳහා ලැබෙන ප්‍රදාන, එම වියදම් දරන කාල පරිච්ඡේදය තුලදීම ආදායම් ප්‍රකාශයේ ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.  ලෙස පිළිගැනේ. වත්කමක පිරිවැය සඳහා විශ්වවිද්‍යාලයට ලැබුන ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව විශ්වවිද්‍යාලය ප්‍රාග්ධන ප්‍රදාන හඳුනාගැනීමේදී ආදායම් ප්‍රවේශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර ඇත.

2019 වර්ෂය තුළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු මූලික ප්‍රාග්ධන ප්‍රදානය රුපියල් 7,000,000.00 ක් වන අතර 2019 වාර්ෂික අයවැයට අනුව භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානය රු. 6,100,000.00 කි. මෙම ප්‍රදාන දෙක 2019 වසරේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන ලෙස වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ඒ අනුව ක්‍රමක්ෂ කර ඇත. ඊට අමතරව රු. 2,115,466.97 ක් උසස් අධ්‍යාපන අමාතාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන ලෙස 2019 දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් පැවරු වත්කම් මත පිළිගෙන ඒ අනුව ක්‍රමක්ෂ කර ඇත.

වාර්තාකරණ මූල්‍ය වර්ෂවලදී මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන පහත දැක්වේ.

| වසර | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 3,000,000.00 | 500,000.00 |

## 2.5 විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය

### 2.5.1 ආදායම හඳුනාගැනීම

ගෙවීම් සිදු කළ දිනය නොසලකා ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ හැකියාව සහ ආදායම විශ්වාසදායක ලෙස මැනීමේ හැකියාව අනුව ආදායම හඳුනා ගනු ලැබේ. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැකවෙන හඳුනාගැනීම් නිර්ණායක ද සම්පූර්ණ කළ යුතුය.

**01. පාඨමාලාවලින් ආදායම**

විශේෂඥ වෛද්‍ය උපාධිවල ආදායම කාලච්ඡේද පදනම මත ආදායම ලෙස හඳුනා ගනී. 2021 වසර සඳහා උත්පාදිත ආදායම ලෙස හඳුනාගත් මුදල රු. 2,991,000.00 ක් වන අතර 2020 වර්ෂය තුළ උත්පාදිත ආදායම ලෙස හඳුනාගත් මුදල රු. 1,086,333.00 ක් වේ.

**02. පොළී ආදායම**

උපචිත පදනම මත පොළී ආදායම හඳුනා ගනු ලැබේ. ලැබූ පොළී ආදායම් සහ ස්ථාවර තැන්පතු ආයෝජන මෙන්ම අරමුදල් කළමනාකරණ ගිණුම මත ලැබිය යුතු පොළීවලින් පොළී ආදායම සමන්විත වේ.

**03. වෙනත් ආදායම**

ඉහත කාණ්ඩ යටතේ විශේෂයෙන් දක්වා නොමැති වෙනත් ඕනෑම ආදායමක් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

### 2.5.2 වියදම් හඳුනා ගැනීම

ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සිදු කිරීම සම්බන්ධ වියදම් උපචිත පදනම මත හඳුනා ගන්නා අතර ඒවා වියදම් කළ කාලපරිච්ඡේදය තුළම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයටඅය කරනු ලැබේ.

## 2.6 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 අනුව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් සකස් කරනු ලබන අතර මෙහෙයුම් කටයුතුවල දළ මූල්‍ය ලැබීම් සහ දළ මූල්‍ය ගෙවීම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන කටයුතු හඳුනා ගෙන ඇත.

## 2.7 වගකීම් සහ අවිනිශ්චිතතාවන්

සිතිය හැකි සියලුම අවදානම් සියලුම වගකීම්වල අගය තීරණය කිරීමේ දී ගිණුම්ගත කර ඇත. අවිනිශ්චිත වගකීම් යනු අනිවිශ්චිත අනාගත සිදුවීම්වලින් සහතික කළ හැකි වන සිදුවිය හැකි බැඳීම් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදු කිරීමේ හැකියාවක් නොමැති සහ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි වර්තමාන බැඳීම් වේ. අවිනිශ්චිත වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොමැති නමුත් ඒවා දුරස්ථ වන්නේ නම් මිස හෙළිදරව් කරනු ලැබේ.

## 2.8 වාර්තා කරන දිනයට පසු සිදුවීම්

වාර්තා කරන කාලපරිච්ඡේදයට පසුව සිදුවන සිදුවීම්වල වැදගත්කම සලකා බලා ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවලට සුදුසු ගැලපීම් සිදු කර ඇත.

**දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**2021 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| සටහන **03**<br>මුදල් හා මුදල් සමාන දෑ | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| BOC බොරැල්ල SG ගිණුම් අංකය:<br>0084061028 - පුනරාවර්තන | 4,099,943 | 4,369,048 |
| BOC බොරැල්ල SG ගිණුම් අංකය:<br>0084060859 - ප්‍රාග්ධන | 487,650 | 494,475 |
| BOC බොරැල්ල SG ගිණුම් අංකය:<br>0085283375 - අරමුදල් කළමනාකරණ ගිණුම | 11,809,163 | 9,161,062 |
| | **16,396,756** | **14,024,586** |

| සටහන **04**<br>ස්ථාවර තැන්පතුවල ආයෝජන | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| BOC බොරැල්ල SG ගිණුම් අංකය:<br>86766165 | 523,201 | 500,000 |
| BOC බොරැල්ල SG ගිණුම් අංකය:<br>86766175 | 523,201 | 500,000 |
| BOC බොරැල්ල SG ගිණුම් අංකය:<br>86766156 | 523,201 | 500,000 |
| BOC බොරැල්ල SG ගිණුම් අංකය:<br>88304410 | 1,870,000 | - |
| | **3,439,604** | **1,500,000** |

| සටහන **05**<br>ලැබිය යුතු දෑ - | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| - | | |
| පූර්ව ගෙවීම් - | 19,016 | - |
| පාඨමාලා ගාස්තු ලැබීම් | 333,333 | - |
| පොලී ආදායම ලැබීම් | 4,730 | 4,283 |
| | **357,080** | **4,283** |

| සටහන 06<br>කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් | 2022 අතරතුර දී ආපසු අය කර ගැනීම් | 2022න් පසුව ආපසු අය කර ගැනීම් | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|---|
| ආපදා ණය | 100,400 | 161,267 | 261,667 | 362,067 |
| පරිගණක ණය | 6,500 | 8,000 | 14,500 | 25,000 |
| ප්‍රවාහන ණය | 26,000 | 32,000 | 58,000 | 100,000 |
| | **132,900** | **201,267** | **334,167** | **487,067** |

| සටහන 07<br>අත්තිකාරම් | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| විවිධ අත්තිකාරම් | 11,307 | - |
| මුද්දර අග්‍රිමය | 7,825 | |
| | **19,132** | - |

| සටහන 08<br>තොග | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| තොග | 463,551 | 95,635 |
| | **463,551** | **95,635** |

**සටහන 09**

**දේපළ පිරියත සහ උපකරණ** රු.

| විස්තරය | 2020.12.31ට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම්/ගැලපීම් | 2021.12.31ට ශේෂය |
|---|---|---|---|---|
| කාර්යාල හා ඉගැන්වීම් උපකරණ | 2,637,346 | 546,300 | - | 3,183,646 |
| පරිගණක හා පරිගණක මෙවලම් | 1,372,717 | 12,250 | - | 1,384,967 |

| | | | | |
|---|---|---|---|---|
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 3,039,900 | - | - | 3,039,900 |
| **එකතුව** | **7,049,963** | **558,550** | - | **7,608,513** |

**<u>ක්ෂයවීම් සඳහා වෙන්කිරීම්</u>**

| විස්තරය | % | 2020.12.31 දිනට ශේෂය | වසර සඳහා ගාස්තුව | ඉවත් කිරීම්/ ගැලපීම් | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| කාර්යාල හා ඉගැන්වීම් උපකරණ | 10 | 375,731 | 272,240 | | 647,971 |
| පරිගණක හා පරිගණක මෙවලම් | 20 | 570,934 | 292,617 | | 863,551 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 10 | 473,789 | 305,198 | | 778,987 |
| **එකතුව** | | **1,420,454** | **870,055** | - | **2,290,509** |

**<u>ලියා හල අගය</u>**

| විස්තරය | 2020.12.31 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම්/ ගැලපීම් | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| කාර්යාල හා ඉගැන්වීම් උපකරණ | 2,261,614 | - | - | 2,535,675 |
| පරිගණක හා පරිගණක මෙවලම් | 801,784 | - | - | 521,417 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 2,566,111 | - | - | 2,260,913 |
| **එකතුව** | **5,629,510** | **-** | - | **5,318,004** |

| **සටහන 10**<br>**සමුච්චිත වියදම්** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| සමුච්චිත විදයම් -පුනරාවර්තන | 3,804,182 | 2,878,956 |
| **එකතුව** | **3,804,182** | **2,878,956** |

| **සටහන 11** | **2021** | **2020** |
|---|---|---|

| ගෙවිය යුතු දෑ | රු. | රු. |
|---|---|---|
| ණයකරුවෝ | 926,000 | 774,900 |
| රඳවා ගැනීම් | 95,850 | 143,195 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 500 | 575 |
| ගෙවිය යුතු රැස්වීම් දීමනාව | - | 12,000 |
| **එකතුව** | **1,022,350** | **930,670** |

| **සටහන 12**<br>**විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ගෙවීම්** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| ජනවාරි 01වැනි දිනට ශේෂය | 1,369,603 | 438,776 |
| වර්ෂය සඳහා ගාස්තුව | 135,701 | 930,827 |
| | 1,505,304 | 1,369,603 |
| වර්ෂය තුළ ගෙවීම් | - | - |
| දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය | **1,505,304** | **1,369,603** |

| **සටහන 13**<br>**වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| ආරම්භක ශේෂය | 3,469,477 | 2,718,626 |
| මාරුකිරීම් | 534,795 | 1,220,346 |
| ක්‍රමක්ෂය | (513,966) | (469,495) |
| | **3,490,305** | **3,469,477** |

| **සටහන 14**<br>**වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| ආරම්භක ශේෂය | 2,422,248 | 3,142,594 |
| වර්ෂය අතරතුර දී එකතු කිරීම් | 3,000,000 | 500,000 |
| මාරු කිරීම් | (534,795) | (1,220,346) |
| | **4,887,453** | **2,422,248** |

| සටහන 15<br>**උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වලින් ප්‍රාග්ධන ප්‍රදාන** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---:|---:|
| ආරම්භක ශේෂය | 8,403,288 | 8,759,378 |
| ක්‍රමක්ෂය | (356,089) | (356,089) |
| | **8,047,199** | **8,403,288** |

| සටහන 16<br>**සමුච්චිත අතිරික්තය හා හිඟය** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---:|---:|
| ජනවාරි මස 01වැනි දිනට ශේෂය | 925,170 | (446,530) |
| ගැලපීම් (පෙර වර්ෂය) | - | - |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය) | 2,121,329 | 1,371,700 |
| දෙසැම්බර් 31වැනි දිනට ශේෂය | **3,046,499** | **925,170** |

| සටහන 17<br>**උත්පාදිත ආදායම** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---:|---:|
| විශේෂඥ උපාධි ලියාපදිංචි ගාස්තුව | 11,000 | 128,000 |
| විශේෂඥ උපාධි පාඨමාලා ගාස්තුව | 2,050,000 | 958,333 |
| විභාග ගාස්තු | 60,000 | - |
| අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වරප්‍රසාද ගාස්තු | 870,000 | - |
| **එකතුව** | **2,991,000** | **1,086,333** |

| සටහන 18<br>**වෙනත් ආදායම්** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---:|---:|
| ණය හා අත්තිකාරම්වලින් පොළිය | 22,525 | 27,198 |
| අරමුදල් කළමණාකරණ ගිණුමෙන් පොළිය | 176,071 | 223,984 |
| ස්ථිර තැන්පතුවලින් පොළිය | 70,051 | 4,283 |
| **එකතුව** | **268,647** | **255,465** |

| සටහන 19<br>**ක්‍රමක්ෂය ආදායම්** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---:|---:|

| | | |
|---|---|---|
| ක්‍රමක්ෂය ආදායම් - රජයේ ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්) | 513,966 | 469,495 |
| ආදායම ක්‍රමක්ෂය - MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්) | 356,089 | 356,089 |
| **එකතුව** | **870,055** | **825,584** |

**මුළු වියදම්**

| **සටහන 20 - අ**<br>**සේවක පඩිනඩි** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| <u>**අධ්‍යයන**</u> | | |
| වැටුප් හා වේතන | 1,736,079 | 862,708 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 723,421 | - |
| විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල | 35,387 | - |
| සේවක භාරකාර අරමුදල | 142,915 | - |
| අධ්‍යයන දීමනා | 2,872,888 | - |
| සංග්‍රහ දිමනා | 135,691 | - |
| වෙනත් දීමනා | 385,143 | - |
| බාහිර කථිකාචාර්ය ගාස්තු | 940,600 | 171,450 |
| පර්යේෂණ දීමනා | 623,127 | - |
| ජීවන වියදම් දීමනා | 110,574 | - |
| වැඩබැලීමේ ගාස්තු | 29,338 | - |
| අතිරේක දීමනා 20% | 356,073 | - |
| **එකතුව** | **8,091,235** | **1,034,158** |
| <u>**අනධ්‍යයන**</u> | | |
| වැටුප් හා වේතන | 2,963,567 | 3,349,301 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 827,408 | 423,536 |
| විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල | 389,368 | 199,311 |
| සේවක භාරකාර අරමුදල | 146,013 | 74,742 |
| මාසික හිලව් දීමනාව | 1,349,251 | 717,513 |
| නිවාඩු ගෙවීම් | 31,583 | 25,919 |
| පාරිතෝෂිකය | 135,701 | 930,827 |

| | | |
|---|---|---|
| අතිකාල | 16,322 | - |
| වෙනත් දීමනා | 97,387 | - |
| පර්යේෂණ දීමනා | 589,554 | 556,368 |
| ජීවන වියදම් දීමනා | 519,518 | 179,400 |
| අතිරේක දීමනා 20% | 599,667 | 318,895 |
| **එකතුව** | **7,665,339** | **6,775,812** |
| **එකතුව** | **15,756,573** | **7,809,970** |

| **සටහන 20 -ආ** **ගමන්වියදම් හා යැපීම් දීමනා** | **2021** රු. | **2020** රු. |
|---|---|---|
| දේශීය | 90,302 | 32,181 |
| එකතුව | **90,302** | **32,181** |

| **සටහන 20 -ඇ** **සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ** | **2021** රු. | **2020** රු. |
|---|---|---|
| ලිපි ලේඛන හා කාර්යාල අවශ්‍යතා | 256,011 | 305,554 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 223,069 | 45,548 |
| යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ | 20,055 | - |
| වෛද්‍ය සැපයුම් | 21,195 | - |
| වෙනත් සැපයුම් | 4,744 | 24,650 |
| **එකතුව** | **525,074** | **375,752** |

| **සටහන 20 - ඈ** **නඩත්තු වියදම්** | **2021** රු. | **2020** රු. |
|---|---|---|
| පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 42,432 | - |
| ගොඩනැගිලි හා ව්‍යුහය | 32,014 | - |
| **එකතුව** | **74,446** | **-** |

| **සටහන 20 - ඉ** **කොන්ත්‍රාත් සේවා** | **2021** රු. | **2020** රු. |
|---|---|---|
| විදුලිසංදේශ | 139,353 | 130,399 |
| තැපැල් ගාස්තු | 29,725 | 16,855 |
| විදුලිය | 300,000 | 480,000 |
| ආරක්ෂක සේවාව | 184,165 | 178,280 |

| | | |
|---|---|---|
| ජලය | 100,000 | 180,000 |
| පිරිසිදු කිරීමේ සේවාව | 129,168 | 228,666 |
| කුලී හා කුලියට ගැනීමේ ගාස්තු | 900,000 | 1,487,820 |
| මුද්‍රණය හා දැන්වීම් ප්‍රචාරණය | 559,757 | 245,182 |
| **එකතුව** | **2,342,167** | **2,947,201** |

| **සටහන 20 – ඊ**<br>**වෙනත් පුනරාවර්තන වියදම්** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| විශේෂ සේවා - පාලක සභාව හා කමිටු | 1,510,708 | 974,194 |
| වැඩමුළු හා සම්මන්ත්‍රණ | - | 10,050 |
| විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් ගාස්තු | 251,962 | 470,000 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව | 41,500 | - |
| දේපළ ණය මත පොලී සහනාධාරය | 182,485 | 177,463 |
| බැංකු ගාස්තු | 4,250 | 4,250 |
| දායකත්ව හා සාමාජික ගාස්තු | 16,000 | 16,000 |
| විභාග ගාස්තු | 119,850 | 4,037 |
| **එකතුව** | **2,126,755** | **1,655,994** |

| **සටහන 20 -උ**<br>**ක්ෂයවීම්** | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|
| ක්ෂය - කාර්යාල හා ඉගැන්වීමේ උපකරණ | 272,240 | 229,304 |
| ක්ෂය - ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 305,198 | 303,770 |
| ක්ෂය - පරිගණක හා පරිගණක මෘදුකාංග | 292,617 | 292,510 |
| **එකතුව** | **870,055** | **825,584** |

## 6. විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/1/PGIIM/2021/FA/07 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 මැයි 20 දින

අධ්‍යක්ෂ,
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ 2017 අංක 5 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියේ 19 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන යටතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණනය උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ආයතනයේ 2021වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය | ආයතනය වෙනුවෙන් වෙනමම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ආ) | 2017 අංක 05 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 4 (ඌ) වගන්තිය | ආයතනයේ ඉගැන්වීම්, පුහුණු කිරීම හෝ පර්යේෂණ කිරීමේ කාර්යය සඳහා පුස්තකාල හා රසායනාගාර පවත්වාගෙන යාම සිදු කළ යුතු වුවද, විගණිත දිනය වූ 2022 මාර්තු 09 වන දින වන විටත් සිසුන්ට පුස්තකාල හා රසායනාගාර පහසුකම් සපයාදී නොතිබුණි. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ආයතනය ස්ථාපිත කළ 2019 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2022 මාර්තු 20 දින වන විටත් ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබානොගෙන ආයතනය විසින් රු.3,370,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) 2019 හා 2020 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2022 මාර්තු 09 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ආ) දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට යෝග්‍ය ඉඩමක් හා ගොඩනැගිල්ලක් තෝරා ගතයුතු බව 2021 මැයි 21 දිනැති 18 වන අධ්‍යක්ෂණ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණු නමුත්, 2022 මාර්තු 09 දින වන විටත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ආයතනය බොරැල්ල ආයුර්වේද රෝහල තුළ පවත්වාගෙන යාම හේතුවෙන් ජලය හා විදුලිය සඳහා වාර්ෂිකව ගෙවීම් සිදු කිරීමට අවධානය යොමුකර 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු. 1,710,000 ක ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 18 දිනැති අංක 2048/46 දරන ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කර තිබුණු දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පළමු ශිෂ්‍ය කණ්ඩායම සඳහා සිසුන් 19 දෙනෙකු 2020 අගෝස්තු 07 දින බඳවාගෙන තිබුණු නමුත් විගණිත දිනය වූ 2022 මාර්තු 09 දින දක්වාම දෙවන ශිෂ්‍ය කණ්ඩායම බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හා භාණ්ඩාගාරයෙන් වාහනයක් මිලදී ගැනීම වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.8,809,163 ක් ලැබී තිබුණු නමුත් වාහන මිලදී ගැනීම අත්හිටුවීම නිසා එම මුදල සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබානොගෙන සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අරමුදල් කළමනාකරණ ගිණුමක තැන්පත් කර තිබුණි.

(ඉ) ආයුර්වේද, සිද්ධ, යුනානි යටතේ අධ්‍යයන මණ්ඩල 12 ක් පත්කර තිබුණු නමුත්, ආයුර්වේද අධ්‍යයන මණ්ඩල යටතේ පාඨමාලා 05 ක් ආරම්භ කර තිබුණද, සිද්ධ හා යුනානි අධ්‍යයන මණ්ඩල යටතේ පාඨමාලා ආරම්භ කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

6

# 7. විගණකාධිපති වාර්තාවට පිළිතුරු

මාගේ අංකය PGIIM/Audit/2021

ඔබේ අංකය - HED/F/1/PGIIM/2021/FA/07

2022 සැප්තැම්බර් 16

*විගණකාධිපති*
*ජාතික විගණන කාර්යාලය*
අංක 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල

මහත්මයාණෙනි,

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව *විගණකාධිපති වාර්තාව*

---

ඔබගේ ඉහත සමාංකය හා 2022 මැයි 20 දින දරණ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම පහත ඉදිරිපත් කෙරේ.

2.2.2 <u>නීති රීති.රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකල නොවීම</u>

| නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණය | අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි | ආයතනයේ සංයුතිය අනුව වෙනමම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම අවශ්‍ය නොවන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශ මගින් ආයතනයේ විගණන කටයුතු සිදු කළ හැකි බව කළමණාකරණ මණ්ඩලය තීරණ කරන ලදී. |
| 2017 අංක 05 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නියමාවලියේ 4 (ඌ) වගන්තිය | ආයතනයේ ඉගැන්වීම්, පුහුණු කිරීම් හෝ පර්යේෂණ කිරීමේ කාර්යය සඳහා පුස්තකාල හා රසායනාගාර පවත්වාගෙන යාම සිදු කළ යුතු වුවද, විගණිත දිනය වූ 2022 මාර්තු 09 වන දින වන විටත් සිසුන්ට පුස්තකාල හා රසායනාගාර පහසුකම් සපයාදී නොතිබුණි. | පුස්තකාලයක් පවත්වාගෙන යාම සඳහා 2021 සැප්තැම්බර් 15 වන දින සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු පත්කර ගැනීමෙන් අනතුරුව පුස්තකාලය ස්ථාපනය කිරීමේ කටයුතු වඩාත් විධිමත්ව සිදුකරගෙන යනු ලබයි. සියලු පහසුකම් සහිත පුස්තකාලයක් විධිමත්ව ස්ථාපනය කිරීම භාරදූර කාර්යයක් වන අතර මේ වන විට ඒ සඳහා අවශ්‍ය මූලික පහසුකම් සංවර්ධනය කරමින් පවතී.<br><br>එහිදී මූලිකවම, පුස්තකාලය සඳහා අවශ්‍ය පොත් පත් හඳුනා ගැනීම, පොත් 105ක් මිලදී ගැනීම, ඒ පොත් සඳහා පොත්වලට නියමිත වර්ගීකරණ අංක යෙදීම, ලේබල් ඇලවීම, සීල් මුද්‍රා තැබීම, පොත් පොකට් |

| | | |
|---|---|---|
| | | ඇලවීම අවසන් කර ඇත. පොත් රාක්ක හා කියවීම් මේස මිලදී ගැනීම, පොත් රාක්ක, පොත් පරිහරණයට හා කියවීම සඳහා පහසුකම් ලබා දීම, පුස්තකාලයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, ඉලෙක්ට්‍රොනික මූලාශ්‍ර හා ඊ පුස්තකාලයක් සංවර්ධනය කිරීම යන කාර්යයන් සම්පූර්ණ කළ යුතුය.<br><br>මෙකී සියලු කාර්යයන් සඳහා විධිමත් අනුමැතීන් ලබා ගැනීම එම කටයුතු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම පියවර ගණනාවකින් යුතු ක්‍රියාකාරකම් වේ. එහිදී පොත් මිලදී ගැනීමේ කාර්යය කාලයක් ගත වන ක්‍රියාවලියකි. ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ පොත් බහුතරයක් ම ඉන්දියාවේ ප්‍රකාශන වන බැවින් ද අනෙක් බටහිර වෛද්‍ය පොත් පත් ද විදේශයන්හි ප්‍රකාශිත ඒවා වන බැවින් ද වත්මන් මූල්‍ය අර්බුධ හේතුවෙන් මිල කැඳවීම්වල සිට පොත් ලැබීම දක්වා විශාල කාලයක් ගත වේ.<br><br>ආයතනයේ සියලු පුහුණුලාභීන් අදාළ පුහුණු මධ්‍යස්ථානවලට අනුයුක්ත කර ඇති බැවින් ආයතනය තුළ රසායනාගාර ඇති කිරීම නිශ්කාරණ වියදමක් වන බැවින් රසායනාගාර පිහිටුවීම සඳහා කටයුතු කර නොමැත. |
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරණ හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රල්බ | ආයතනයේ ස්ථාපිත කළ 2019 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2022 මාර්තු 20 දින වන විටත් ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ඇඟිලි සලකුණු යන්ත්‍රය සවිකර ඇත. |
| 2003 ජූනි 02 දිනැති අංක පීඩ්/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන ආයතනය විසින් රු.3,370,000 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය | මෙම ස්ථාවර තැන්පතු සඳහා අනුමැතිය ලබා ගැනීමට භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. |

**2.3 වෙනත් කරුණු**

(අ) 2019 වාර්ෂික වාර්තාව ත්‍රෛභාෂාත්‍රයෙන් සකස් කිරීමෙන් පසුව 2021.09.23 වන දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කළ අතර 2022.08.12 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදි.

2020 වාර්ෂික වාර්තාව ත්‍රෛභාෂාත්‍රයෙන් සකස් කර ඇති අතර 2022.03.16 වන දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කර ඇත.

(ආ) 2021.04.23 වන දින පැවති 17 වන කළමණාකරණ රැස්වීමේදී ඉඩමක් හා ගොඩනැගිල්ලක් හඳුනා ගැනීම දෙවන විකල්පය ලෙස හඳුනාගෙන ඇති අතර පළමු විකල්පය ලෙස හඳුනාගෙන ඇත්තේ කොළඹ

විශ්වවිද්‍යාලයට අයත් ජාතික ආයුර්වේද රෝහල ඉදිරිපිට පිහිටා ඇති ඉඩමේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයට හා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පොදු එක් ගොඩනැගිල්ලක් ඉදිකිරීමයි.

කෙසේ නමුත් ආයතනය වෙත විධිමත් කාර්යාල පරිශ්‍රයක් පිහිටුවීමේ අවශ්‍යතාවය සළකා බලා සුදුසු ඉඩමක් හා ගොඩනැගිල්ලක් හඳුනාගැනීමේ කටයුතු කිරීම පිණිස කමිටුවක් පත් කළ ද 2021.07.28 වැනි දිනැතිව නිකුත් කෙරුණු ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2021 හි 2.3 මූලධන වියදම් ආයතනික (අ) මූලධන වියදම් යටතේ නව ගොඩනැගිලි ඉදිකිරීමට තාවකාලිකව අත්හිටුවීමට රජය විසින් ගෙන ඇති තීරණය දීර්ඝ කරන බව දක්වා ඇත. තවද එකී චක්‍රලේඛයේම නව ගොඩනැගිලි කුලියට ලබා ගැනීමට. .ඉල්ලුම් නොකළ යුතු බව දක්වා ඇත.

එබැවින් ආයතනය ඉතා සීමිත කාර්ය මණ්ඩලයක් සහිතව රාජකාරි කටයුතු සිදු කිරීම, කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ රජයේ උපදෙස් පිට වරින් වර ආයතනය වසා තැබීම 2021 වසර තුළ බාධාවන් සමඟ රාජකාරී කිරීමේදී ආයතනයේ වෙනත් කඩිනමින් ඉටුකළ යුතු වැඩවලට මූලිකත්වය ලබාදුන් අතර ඉහත චක්‍රලේඛ ප්‍රකාරව කඩිනමින් ගොඩනැගිල්ල ඉදිකිරීම හෝ කුලියට ගැනීම සිදු කළ නොහැකි නිසා උක්ත කමිටුව රැස්කිරීමට කටයුතු නොකරන ලදී.

2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ජලය හා විදුලිය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ඇතත් ආයුර්වේද ශික්ෂණ රෝහල විසින් ඊට අදාල නිශ්චිත වටිනාකම මෙතෙක් දන්වා නොමැති බැවින් ඊට අදාල ගෙවීම් කර නොමැත.

(ඇ) MD in Ayurveda & Board Certification පාඨමාලාව සඳහා පළමු කණ්ඩායම 2020 අගෝස්තු 07 ආරම්භ කළද පහත සඳහන් හේතු නිසා 2022 මාර්තු 09 දක්වා දෙවන කණ්ඩායම බඳවා ගැනීමට නොහැකි විය.

1. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් බිහිකරනු ලබන විශේෂඥ පුහුණු සහතිකලාභීන් මූලිකවම ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති රෝහල්වල අවශ්‍යතාවය පරිදි පිටකරන අතර තවමත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හෝ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් එක් එක් විශේෂඥතාවය යටතේ තනතුරු වෙන් වෙන් වශයෙන් දක්වා ආයතනය වෙත එවා නොමැති වීම.

2. ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ සිටින විශේෂඥ වෛද්‍යවරුන් කොටසක් පුහුණු කටයුතුවලින් ඉවත්වීම නිසා පුහුණු මධ්‍යස්ථානවල හිගයක් ඇතිවීම.

3. මේ වන විට ආයතනය විසින් MD ආයුර්වේද පාඨමාලා 07ක් සකස් කර කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභා අනුමැතිය සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අනුමැතිය පිණිස යොමුකර තිබුණද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය මේ වන විට හිමිව ඇත්තේ පාඨමාලා 5ක් සඳහා පමණි. ඉතිරි පාඨමාලා 02 සඳහා ද අනුමැතිය කඩිනමින් ලැබේ යැයි පැවති අපේක්ෂාව.

4. එක් එක් විශේෂඥ මණ්ඩලවලට අයත් පාඨමාලා සඳහා වෙන් වෙන්ව බඳවාගැනීමේ පරීක්ෂණ පැවැත්වීම කාලය, මුදල් හා ශ්‍රමය නාස්තියක් බව පෙනී යයි. එබැවින් පාඨමාලා 07 සඳහාම සිසුන් බඳවා ගැනීමට එක් තෝරා ගැනීමේ පරීක්ෂණයක් පැවැත්වීම සුදුසු වීම.

මේ වන විට ආයුර්වේද පාඨමාලාවේ දෙවන කණ්ඩායම බඳවා ගෙන ඇති අතර 2022.09.19 දින සිට අධ්‍යයන පාඨමාලා ආරම්භ කරනු ලැබේ.

(ඈ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2021.05.03 හා 2021.09.22 දිනැති ලිපි මඟින් මෙම මුදල් පුනරුත්තාපන හා වැඩි දියුණු කිරීම් ව්‍යාපෘති හා ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් භාවිතා කළ යුතු බව දන්වා ඇත. ඒ අනුව 2021/2023 කාල පරිච්ඡේදය සඳහා අවශ්‍ය ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා මෙම අරමුදල් භාවිතා කිරීමට 2021 දෙසැම්බර් 03 පැවති මුදල් කමිටු මඟින් නිර්දේශ කළ අතර එය 2022/02/21 පැවති කළමනාකරණ කමිටුව මඟින් අනුමත කරන ලදි. ඒ අනුව ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.

(ඉ) ආයුර්වේද භෛෂජ්‍ය කල්පන හා රස ශාස්ත්‍ර, ආයුර්වේද ශාලක්‍යතන්ත්‍ර, සිද්ධ මරුතුවම්, සිද්ධ ගුණපාඩම්, යුනානි ඉල්මුල් ඇඩ්වියා සහ යුනානි අම්රාස් ඊ නිස්වාන් යන පාඨමාලාවලට අනුමැතීන් ලබා ගැනීම පිණිස අදාල අයදුම්පත් කොළඹ විශ්වවිද්‍යාලයීය සනාතන සභා සහ පාලක සභා අනුමැතිය සහිතව තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර පැවතිය ද එම පාඨමාලා සඳහා තවමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබී නැත.

ආයතනය විසින් මේ සම්බන්ධයෙන් සිදු කළ යුතු සියලු කටයුතු මේ වන විට සිදු කර ඇති බව දන්වමි.

අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## 8. තිරසර සංවර්ධනය සඳහා යෝජනාව

1. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 2019 වසරේ දී පිහිටුවනු ලැබූ අතර සෞඛ්‍ය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා අවශ්‍ය කරන මානව සම්පත සම්පූර්ණ කිරීම පිණිස ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධ ආයතන සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දිවයිනේ මිනිස් බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම පිණිස සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම අරමුණ ඉටු කර ගැනීම පිණිස 2020 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. දේශීය වෛද්‍ය විද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පිරිනැමීම තුළින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම වයස් කාණ්ඩවල තැනැත්තන් සඳහා සෞඛ්‍යසම්පන්න දිවිපැවැත්මක් සහතික කිරීමට සහ ඔවුන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට** අනුබල දෙනු ලබයි.

2. ආයතනය ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය අංශය සඳහා සුදුසුකම්ලත් විශේෂඥ වෛද්‍ය උපාධිධාරීන් බිහි කිරීම පිණිස අධ්‍යයන කටයුතු පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව ආයතනය මඟින් තත්ත්ව සහතික වැඩසටහන් හරහා විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණුවන්නන්ගේ ඉහළම ගුණාත්මකභාවය පිණිස ශික්ෂණය පිරිනැමීමේ පරමාර්ථය ඇතිව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා තත්ත්ව සහතික මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා මූලික සැලසුම් සකස් කර ඇත. තව ද ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේදී අවශ්‍ය වන ඉගෙනුම් තොරතුරු මූලාශ්‍ර ශිෂ්‍යයන් වෙත ලබා දීම ඉතා වැදගත් ය. එසේම මෙම තොරතුරු සම්පත් විවිධ ව්‍යාප්ති සේවා හරහා ලබා දීම සිදු කළ හැක, සියල්ලන්ට සමාන වූ තොරතුරු වෙත ප්‍රවේශවීමේ අවස්ථාව ලබාදීම, එසේම අධ්‍යාපනික අවස්ථා අවශ්‍යතා සඳහා කියවීමේ පහසුකම් සැපයීම මඟින් නිරන්තරව පර්යේෂණයන්හි හා අධ්‍යාපන කටයුතු වල නිරත වීමට කාලය හා අවස්ථාව පර්යේෂකයන් සඳහා හිමිවනු ඇත. එබැවින් එය ගුණාත්මක අධ්‍යාපනයක් හා අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. පුස්තකාලය යනු අධ්‍යාපන ආයතනයක හදවත යනුවෙන් හැඳින්වේ. පශ්චාත් උපාධි ආයතනයක පුස්තකාල යනු පර්යේෂණවල නියැලෙන පර්යේෂකයින් හට දැනුම ලබා දෙන දැනුම් උල්පතයි. අධ්‍යයන මණ්ඩල වල උපදෙස් පරිදි එකතු සංවර්ධනය සිදු කර ගෙන යන අතර පුස්තකාලයේ අරමුණු වනුයේ මූලික වශයෙන් ඒ ඒ විෂයයන්ට අදාළ මුද්‍රිත එකතුවක් ගොඩ නැගීමෙන් අනතුරුව ඉලෙක්ට්‍රොනික් එකතුවක් ආරම්භ කිරීම හා සංවර්ධනය කරමින් ඊ පුස්තකාලයක් සංවර්ධනය කිරීමයි ඒඅතරතුර විවිධ වශයෙන් පුස්තකාලය මඟින් විවිධ තොරතුරු වැඩමුළු සංවිධානය කිරීමට නියමිතයි. පුස්තකාල මූලාශ්‍ර භාවිතයට, කියවීමේ අධ්‍යයන කටයුතුවල නිරතවීමේ පහසුකම් ලබා දීම, අන්තර්ජාල පහසුකම් සැපයීම හා පරිගණක පහසුකම් සැපයීම යන ආකාරයට යටිතල පහසුකම් වර්ධනය කිරීම ද ගුණාත්මක අධ්‍යාපනයට මග පාදයි. **ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට සහ ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීමට** අනුග්‍රහය දක්වනු ලැබේ.

**3.** ආයතනය **සැමවිටම ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාව** පවත්වා ගැනීම පිණිස පියවර ගනු ලබයි. එහිදී පුස්තකාලය මගින් වෛද්‍ය සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සඳහා සහාය වෙමින් තොරතුරු වෙත ප්‍රවේශවීමේ වීමේ සිට එම තොරතුරු අත්පත් කරගැනීම දක්වා වැඩ කටයුතු කරනු ලබයි. ඒ අනුව තොරතුරු සඳහා සාධාරණ ප්‍රවේශය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, පුද්ගල නිදහස, සංස්කෘතික නිදහස හා **ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය** පුස්තකාලය තුළ ආරක්ෂා කෙරෙනු ඇත**.**

4. මෑතක දී පිහිටුවන ලද ආයතනයක් ලෙස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම තැනැත්තන් සඳහා ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ තිරසර කළමනාකරණය තහවුරු කිරීම** පිළිබඳ ක්‍රියාවලිය දියත් කරමින් ඇත. මේ සඳහා මූලාරම්භයක් ලෙස, ආයතනය මගින් කුණු කසළ දිරාපත් වන ද්‍රව්‍ය - වීදුරු, පොලිතින්/ ප්ලාස්ටික් සහ කඩදාසි ආදී ලෙස වෙන් වෙන් වශයෙන් කාණ්ඩ කර, යෝග්‍ය පරිදි බැහැර කිරීම සඳහා පියවර ගෙන ඇත.

5. ආයතනය ශ්‍රී ලංකාව තුළ දේශීය වෛද්‍ය අංශය තුළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ක්ෂේත්‍ර සඳහා විශේෂඥ වෛද්‍ය උපාධි පිරිනමනු ලබයි. මෙම විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා විවිධ ජාතීන්ට අයත් පුහුණුවන්නන් සහභාගී වෙයි. මේ වන විට ආයුර්වේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පමණක් ආරම්භ කර ඇති අතර නුදුරු අනාගතයේදීම යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීම පිණිස පියවර ගෙන ඇත. තව ද, සිද්ධ පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් ද ඉතා ඉක්මනින් හඳුන්වාදීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ඉටු කරමින් තිබේ. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විවිධ ජාතීන් සහ ආගම්වලට අයත් පුහුණුවන්නන් අතර අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගීම පිණිස අවශ්‍ය සියලුම පියවර ගනු ලබයි.

6. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් පිරිනමනු ලබන සියලුම විශේෂඥ වෛද්‍ය උපාධිවල පශ්චාත්-විශේෂඥ උපාධි වැඩසටහනේ අවසන් වසර සඳහා එක් අවුරුදු විදේශීය පුහුණුවක් ඇතුළත් වේ. මේ සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් වෙනත් රටවල අධ්‍යාපන ආයතන සමඟ අවබෝධාත්මක ගිවිසුම්වලට එළැඹීමට සැලසුම් කරමින් ඇත (විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍ය උපාධිධාරීන් සඳහා අවසන් වසර පුහුණුව ලබා ගැනීම පිණිස ඉන්දියාවේ උසස් අධ්‍යාපන ආයතන සමඟ ගිවිසුම්වලට එළැඹීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හරහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

මඟින් එහි ශිෂ්‍යයින්ට සහ කාර්ය මණ්ඩලයට ජාතික සහ අන්තර්ජාතික සබඳතා ගොඩනගා ගැනීම සඳහා අවකාශය සලසා දෙනු ලැබේ.)

7. තව ද අන්තර්ජාතික වශයෙන් වැදගත් තොරතුරු මූලාශ්‍ර සඳහා ප්‍රවේශය ලබා ගැනීම් මගින් දැනුම් සම්භාරයක් සිසුන්ට ලබා ගත හැකිවේ. පුස්තකාල ජාල සමඟ සම්බන්ධ වෙමින් නව දැනුම් උත්පාදනයන් සඳහා ප්‍රවේශ වීමට කටයුතු යොදා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලය, සෞඛ්‍යය සාහිත්‍ය, පුස්තකාල හා තොරතුරු විද්‍යාව යන ජාල සඳහා, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය යන ආයතන හා පුස්තකාල තොරතුරු ජාල සමග සම්බන්ධ වෙමින් අන්තර් සහයෝගීතාවය ඇති කර ගැනීමට කටයුතු කර ඇත . ඒ අනුව නව දැනුම් උත්පාදනයන්ට, පර්යේෂණයන් සඳහා අවශ්‍ය වන දැනුමින් සන්නද්ධ කිරීම සඳහා වන පුස්තකාල හා තොරතුරු සේවාවන් පුස්තකාලය විසින් පවත්වාගෙන යනු ලබයි.

-